# නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

ආපදා අවදානම් ස්ථානීය අංක 125

පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී. (99/7 - 99/8) කණු අතර (වැලිමඩ)

බදුල්ල දිස්ත්‍රික්කය

2022 මාර්තු

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දුඃක: 011 2588946/011 2503826/ 011 2503431

## පටුන

**1. හැඳින්වීම ......................................................................................................1**

1.1 ව්‍යාපෘති සාරාංශය....................................................................................................1

1.2 අපේක්ෂිත පරිශීලකයන්.................................................................................................2

**2. ව්‍යාපෘතියේ හා හඳුනාගත් ස්ථානයේ විස්තර.......................................................................2**

2.1. හඳුනාගත් ස්ථානය.......................................................................................................2

2.2. ස්ථානීය විස්තර...........................................................................................................2

2.3 භූ විද්‍යාත්මක ස්වභාවය හා ඉඩම් හිමිකාරිත්වය.......................................................................3

2.4 ප්‍රදේශයේ දේශගුණික හා කාලගුණික තත්ත්වය........................................................................5

**3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු........................................................................5**

3.1 සිදුවීම් සංඛ්‍යාව...........................................................................................................5

3.2 නායයෑම් බලපෑම් සහ ප්‍රතිවිපාක.....................................................................................6

3.3 නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග...................................6

3.4 පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම.........................................................................6

3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය)............................................................................................6

**4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ස්ථානය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම........................................................................................................8**

**5. මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග..........................................8**

**6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංවේදී සංරචකයන්..............................9**

**7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම.......10**

7.1. හිතකර බලපෑම්.........................................................................................................12

7.2 අහිතකර බලපෑම්..........................................................................................................12

7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම..........................................12

7.2.2 පාරිසරික බලපෑම....................................................................................................13

7.2.3 ජෛව විද්‍යාත්මක/ පරිසර විද්‍යාත්මක බලපෑම..............................................................14

7.2.4 සමාජ ආර්ථික බලපෑම...............................................................................................15

**8. පාරිසරික හා සමාජයීය බලපෑම්වල තීව්‍රතාව..................................................................18**

8.1 ප්‍රමුඛතාව දිය යුතු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු: කොන්ත්‍රාත්කරු සඳහා වන සම්මත නිර්දේශයන් ඉක්මවා අවධානය යොමු කළ සෞඛ්‍ය හා සමාජයීය සාධක.................................................18

8.2 ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය....................................................................................18

**9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP).......................................................18**

9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම..........................................................................18

9.2. පුද්ගලයින් ඉවත් කිරීම.................................................................................................18

9.3. හානිවන ගෘහනැගිලි/ යටිතල පහසුකම් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (ඒ සඳහා හිමිකරුවන්ගේ එකගතාව ලබා ගැනීම).........................................................................18

9.4. ව්‍යාපෘතිය හේතුවෙන් දේපොළ / ඒවායේ භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ලබා දීමේ අවශ්‍යතාව ....19

9.5. මහජන දැනුවත් කිරීම් සහ අවබෝධය ලබා දීම - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා ....19

9.6. පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/ සමාජයීය කළමනාකරණ නිර්දේශයන් ....19

9.7. ඉදිකිරීම් අදියරයේදී සිදුවන බලපෑම අවම කිරීම ....21

9.7.1. ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව ....21

9.7.2. ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය ....23

**11. මහජනතාව හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම - දැනට පවත්වා ඇති සහ පැවැත්වීමට නියමිත මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් ....28**

11.1 මහජන දැනුවත් කිරීම ....28

10.2 පාර්ශවකරුවන්/ ආයතන දැනුවත් කිරීම ....29

**11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර ....30**

**12. ශ්‍රම කළමනාකරණය ....30**

**13. නිශ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවල අනුමැතිය ලබා ගැනීම ....31**

10.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ....31

10.2 ව්‍යාපෘතියට අයත් වන රජයේ ඉඩම් හිමිකාරිත්වයේ අනුමැතිය ලබා ගැනීම ....31

10.3 ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව පිළිබඳ පෞද්ගලික ඉඩම් හිමිකරුවන් සමඟ නීත්‍යානුකූල ගිවිසුම ....32

**14. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය ....33**

**15. තොරතුරු නිකුත් කිරීම ....33**

**ඇමුණුම ෴ ස්ථානීය ස්වභාවය සහ දැනුවත් කිරීම් ....34**

## රූප සටහන් ලැයිස්තුව


රූප සටහන 01ඃ හඳුනාගත් ස්ථානයට ප්‍රවේශ මාර්ගය ........................................................................ 3

රූප සටහන 02ඃ අවදානම් අවමකරණ ප්‍රදේශයේ හරස්කඩ පිහිටීම........................................................ 4

රූප සටහන 03ඃ යෝජිත අවදානම් අවමකරණ ස්ථානය, අවට පරිසරය සහ පොදු සේවා පහසුකම් දැක්වෙන Google ඡායාරූපය ........................................................................................................ 4

රූප සටහන 04ඃ වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය හා වර්ෂාපතනය.......................................................... 5

රූප සටහන 05: හඳුනාගත් ස්ථානයේ ඉඩම් භාවිතය, අවදානමට ලක්ව ඇති සංරචක සහ ස්ථානයේ භූ හරස්කඩ තොරතුරු දැක්වෙන ඩ්‍රෝන ඡායාරූපය ................................................................................... 7

රූප සටහන 06: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි හිතකර සහ අහිතකර බලපෑම් සහ ඒවායේ වැදගත්කම පිළිබඳ සාරාංශය........................................................................................................11


## වගු සටහන් ලැයිස්තුව


වගුව අංක 1ඃ අහිතකර බලපෑම් සහ එම බලපෑම්වල තීව්‍රතාව .............................................................12

වගුව අංක 02ඃ පිරිසැලසුම්කරණ අදියර සඳහා පාරිසරික හා සමාජයීය නිර්ණායකයන්........................19

වගුව අංක 03ඃ දී සහ පී කළමනාකරණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාව........... 22

වගුව 05: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය .................................. 27

වගුව අංක 06ඃ නිශ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව සහ අනුමැතිය ලබා ගැනීම..........................31

අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව වගු අංක 07 හි දක්වා ඇත. .............32

වගුව අංක 07ඃ අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව.................................32

වගුව 08: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය ......................................................................33

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලි බල මණ්ඩලය |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| EH & S | පාරිසරික, සෞඛ්‍ය සහ සමාජයීය සාධක |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික සහ සමාජයීය ඒකකය |
| ESMF | පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව |
| ESMP | පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |
| GN | ග්‍රාම නිලධාරී |
| GOSL | ශ්‍රී ලංකා ආණ්ඩුව |
| GSMB | භූ සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය |
| LHS | වම් පස පෙදෙස |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| RHS | දකුණු පස පෙදෙස |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |

## 1. හැඳින්වීම

### 1.1 ව්‍යාපෘති සාරාංශය

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ පළාත් 6කට අයත් දිස්ත්‍රික්ක 11ක ආපදා අධි අවදානම් කලාපවල පිහිටා ඇති අස්ථායී බෑවුම් සඳහා පිළියම් යෙදීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා ණය ආධාර සපයනු ලබන්නේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසිනි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB හා ශ්‍රී ලංකා රජයේ නීතිරීති සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූල වීම අත්‍යාවශ්‍ය වේ. AIIB හි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිමය අවශ්‍යතාව අනුව ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාත්මක කිරිමේ ක්‍රමවේදය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය සඳහා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් (ESMF) නිර්මාණය කළ යුතුය.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවෙහි (ESMF) අරමුණ වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ දී AIIB හි ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික ප්‍රඥප්ති හා සමාජයීය ප්‍රඥප්ති පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) නම් කර ඇත. ව්‍යාපෘතියට සම්බන්ධ වන සියළුම පාර්ශවයන් පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව (ESMF) යටතේ සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි NBRO විසින් අපේක්ෂා කෙරේ. එමගින් ව්‍යාපෘති කාලසීමාව අතරතුර පරිසරයට හා සමාජයට වන බලපෑම අවම වනු ඇත.

පාරිසරික හා සමාජයීය සැකැස්ම සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස්වන විශේෂිත තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. එබැවින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවට (ESMF) අනුව එක් එක් නායයෑම් ස්ථානයට අදාළව පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) සැකසිය යුතුය. මෙම ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමනාකරණය පිළිබඳ සැළසුම් මගින් ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීම, පිරිසැලසුම් කිරීම (Design), ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම යන අදියරයන්හි දී පාරිසරික, සමාජයීය, සෞඛ්‍ය, සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශයන් සපයනු ඇත.

පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී. 99/7 කණුව සිට 99/8 කණුව දක්වා හාලි ඇළ අවදානම් අවමකරණ ස්ථානයට අදාළ පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලැස්ම මෙහි දැක්වේ. ප්‍රදේශයේ පාරිසරික හා සමාජයීය සාධකයන් පිළිබඳව පුළුල් අධ්‍යයනයකින් පසු මෙම සැලැස්ම සකස් කර ඇති අතර එමගින් පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරනු ලබයි.

i. ව්‍යාපෘතියේ බලපෑමට හසුවන ප්‍රදේශයේ පවත්නා සංවේදී පාරිසරික හා සමාජයීය ලාක්ෂණිකයන් හඳුනා ගැනීම
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවිය හැකි සුවිශේෂී පාරිසරික හා සමාජයීය බලපෑම් හඳුනා ගැනීම

iii. අවදානම් අවමකරණ පියවරයන් යෝජනා කිරීම
iv. මෙම ව්‍යාපෘතියට විශේෂිත යෝග්‍ය පාරිසරික හා සමාජයීය අවශ්‍යතාවන් හඳුනා ගැනීම
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය තුළ අනුගමනය කළ යුතු විශේෂිත පාරිසරික හා සමාජයීය රෙගුලාසි සහ විධි විධාන පිළිබඳ අධ්‍යයනය කිරීම

### 1.2 අපේක්ෂිත පරිශීලකයන්

ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය ගැටලු පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් මෙම ලේඛනය තුළින් සපයනු ලබන අතර ඉදිකිරීම් අදියරයේදී එම අහිතකර බලපෑම් පාලනය සහ අවම කිරීම සඳහා පිරිසැලසුම් කණ්ඩායම, PMU සහ කොන්ත්‍රාත්කරු විසින් එම තොරතුරු භාවිත කරනු ඇත. ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වෙබ් අඩවියේ (NBRO Website) ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වනු ලබන ඕනෑම පාර්ශවයකට (මහජනතාවට හෝ පාර්ශවකාර සංවිධානවලට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එමගින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ (SS- ESMAP) කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත.

## 2. ව්‍යාපෘතියේ හා හඳුනාගත් ස්ථානයේ විස්තර

### 2.1. හඳුනාගත් ස්ථානය

අවදානම් අවමකරණ ස්ථානීය අංක 125, බදුල්ල දිස්ත්‍රික්කයේ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී. 99/7 කණුව සිට 99/8 කණුව දක්වා හාලි ඇළ අවදානම් අවමකරණ ස්ථානයට

### 2.2. ස්ථානීය විස්තර

යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානය, ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොස්කණුවේගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

**හඳුනාගත් ස්ථානයේ GPS ඛණ්ඩාංක** – 6.913808°N සහ 80.956629°E

***උන්නතාංශය*** – මුහුදු මට්ටමේ සිට මීටර් 871/ අඩි 2860ක් පමණ වේ

**ආසන්නතම නගරය** – හඳුනාගත් ස්ථානයේ සිට ආසන්නතම නගරය වන වැලිමඩ නගරයට කි.මී. 8.6ක් පමණ දුරින් මෙම සථානය පිහිටා ඇත

**ප්‍රවේශ මාර්ගය** - කොළඹ කොටුව සිට අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ කි.මී. 199ක් පමණ දුරින් පිහිටා ඇත. පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ (A5) වැලිමඩ නගරයේ සිට බදුල්ල දෙසට කි.මී. 8.6ක් පමණ ගමන් කිරීමෙන් මාර්ගයේ දකුණු පස පිහිටි මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකිය.




*රූප සටහන 01ඃ හඳුනාගත් ස්ථානයට ප්‍රවේශ මාර්ගය*

**2.3 භූ විද්‍යාත්මක ස්වභාවය හා ඉඩම් හිමිකාරිත්වය**

පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ (A5) වැලිමඩ නගරයේ සිට බදුල්ල දෙසට ගමන් කිරීමේදී මාර්ගයේ දකුණු පස පිහිටි මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකිය. පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ (A5) පහළ බෑවුම දෙසට සිරස් කණ්ඩි කැපීම් නිරීක්ෂණය කළ හැකිය. හඳුනාගත් ස්ථානයට ඉහළින් අඩි පාරක් පිහිටා ඇත. එම අඩි පාරට පහළින් බෑවුම් අස්ථායී වීම සිදුව ඇති අතර එම අඩි පාරට පහළින් මීටර් 60ක් පමණ දක්වා කොටසෙහි අංශක 35 - 40ත් අතර බෑවුම් ස්වභාවයක් පවතී. රූප සටහන අංක දෙක පරිශීලනය කිරීමෙන් මෙම ප්‍රදේශයේ බෑවුම සහ භූ විද්‍යාත්මක ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.

අවදානම් අවමකරණ ව්‍යාපෘතියට අයත් වන භූමි ප්‍රමාණය වර්ග මීටර් 30,000ක් පමණ වන අතර ඉඩම් හිමිකාරිත්වය මල්වත්ත වතු සමාගමට අයත් ඇටම්පිටිය වත්තට අයත් වේ.




*රූප සටහන 02: අවදානම් අවමකරණ ප්‍රදේශයේ හරස්කඩ පිහිටීම*




*රූප සටහන 03: යෝජිත අවදානම් අවමකරණ ස්ථානය, අවට පරිසරය සහ පොදු සේවා පහසුකම් දැක්වෙන Google ඡායාරූපය*

### 2.4 ප්‍රදේශයේ දේශගුණික හා කාළගුණික තත්ත්වය

අවදානම් අවමකරණ ස්ථානය මුහුදු මට්ටමේ සිට මීටර් 871ක් පමණ උසකින් පිහිටා ඇත. නිවර්තන කාළගුණික තත්ත්වයක් ප්‍රදේශයේ පවතී. වර්ෂය පුරා සැලකිය යුතු මට්ටමේ වර්ෂාපතනයක් ලැබේ. අඩුම වර්ෂාපතනයක් පවතින මාසයේදී ද සැලකිය යුතු වර්ෂාපතනයක් ඇද හැලීමෙන් මෙම තත්ත්වය තහවුරු වේ. ඇටම්පිටිය ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 26ක් (ෆැරන්හයිට් අංශක 78.8ක්) පමණ වේ. වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2800ක් (අඟල් 110ක්) පමණ වේ. (මූලාශ්‍රයඃ *Source: www.worldweatheronline.com).*




*රූපසටහන 04ඃ වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය හා වර්ෂාපතනය*

### 3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු

### 3.1 සිදුවීම් සංඛ්‍යාව

ආසන්න වෙළෙඳසැල් හිමිකරු ප්‍රකාශ කළ ආකාරයට පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය දිගට පාෂාණ කුට්ටි වැටීම, බෑවුම් අස්ථායී වීම සහ මාර්ගයට සුන්බුන් වැටීම වැළැක්වීම සඳහා 2009 වර්ෂයට පෙර අඩි 3ක් පමණ උසකින් යුත් රැඳවුම් බිත්තියක් පැවතී ඇත. 2009 වර්ෂයේදී මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෙම රැඳවුම් බිත්තිය කඩා ඉවත් කර ඇත. 2012 සහ 2013 වර්ෂවලදී විශාල පාෂාණ කුට්ටි වැටීමක් සිදු වී ඇත. මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සහ ආසන්න ප්‍රදේශයේ පාෂාණ කොටස් පුපුරවා හැරීම මෙම තත්ත්වයට හේතු වී ඇත. ස්ථානීය පරීක්ෂාවේදී මාර්ගයට ආසන්න බෑවුම මත පාෂාණ කුට්ටි සහ අවසාධිත කොටස් (පාෂාණ කුට්ටි සහ පාංශු අවසාධිත) නිරීක්ෂණය කළ හැකිය.

මල්වත්ත කුඩා ජලවිදුලි බලාගාරයේ භාරකරු ජයසේකර මහතා ප්‍රකාශ කළ ආකාරයට වර්ෂා කාලයන්වල පමණක් නොව වර්ෂාව නොමැති කාලයන් තුළ ද ඔවුන් පාෂාණ කුට්ටි වැටීමේ, පාංශු ස්ථර හා සුන්බුන් වැටීම් සිදු වේ. 2015 වර්ෂයේදී විශාල පාෂාණ කුට්ටි සහ පාංශු ස්ථර වැටීමක් සිදුව ඇත. ඉන් කුඩා ජල විදුලි බලාගාරයට, පේරාදෙණිය- බදුල්ල- චෙන්කලාඩි මාර්ගයට (A5) සහ හඳුනාගත් ස්ථානයට පහළින් ගමන් කරන උමා ඔයෙහි අතු ගංගාවට බලපෑම් සිදුව ඇත.

LRRMD/NBRO හි භූ විද්‍යාඥයන් හඳුනා ගෙන ඇති ආකාරයට පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය දිගට වැලිමඩ ප්‍රදේශයේ කි.මී. 99/7 හා 99/8 බෝක්කු අතර ඉහළ බෑවුමේ අස්ථායී පාංශු ස්ථරය නැවත සක්‍රිය වී බෑවුම් අස්ථායීතාවක් සිදු වීමේ අවදානමක් පවතී.

### 3.2 නායයෑම් බලපෑම් සහ ප්‍රතිවිපාක

අධික වර්ෂා කාල සීමාවන්හිදී අස්ථායී බෑවුමෙහි ඇති අවිධිමත් පාංශු ස්ථරයන් හා පාෂාණ කුට්ටි මාර්ගයට වැටීමේ අවදානමක් පවතින අතර ඉන් පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය (A5) භාවිත කරන රථවාහන, පදිකයින් සහ මගීන් අවදානමට ලක් වේ. බෑවුම් අස්ථායී වීමෙන් විසිරී යන සුන්බුන් හේතුවෙන් මාර්ගයට පහළින් ඇති මෙම ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන ශාඛ වර්ග හායනයට ලක්වීමේ අවදානම පවතී. ඊට අමතරව, පහළ බෑවුමේ ඇති කුඩා පරිමාණ විදුලි බලාගාරය, ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ජල නළ සැපයුම් පද්ධති, CEB අධි සැර විදුලි බල සැපයුම් පද්ධති යනාදිය අවදානමට ලක් වේ. පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය (A5) මාර්ගයට සමාන්තරව උමා ඔය ගමන් කරන බැවින් එහ ජලය භාවිත කරන කරන්නන් බෑවුම් අස්ථායී වීමේ අවදානමට මුහුණ දෙනු ලබයි.

### 3.3 නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග

අවදානම්කාරී බව (පාෂාණ කුට්ටි වැටීම) දැක්වෙන සංඥා පුවරු හැර මෙම ස්ථානයේ අවදානම් අවම කිරීම සඳහා වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත..

### 3.4 පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම

අවදානම හේතුවෙන් කිසිදු ගොඩනැගිල්ලක් මෙම ස්ථානයෙන් ඉවත් කර නොමැත.

### 3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය)

මෙම ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමක් සිදු නොවේ.




*රූප සටහන 05: හඳුනාගත් ස්ථානයේ ඉඩම් භාවිතය, අවදානමට ලක්ව ඇති සංරචක සහ ස්ථානයේ හු හරස්කඩ තොරතුරු දැක්වෙන ඩ්‍රෝන ඡායාරූපය*

## 4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ස්ථානය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම

### 4.1 බෑවුම් අස්ථායී ප්‍රදේශය ආශ්‍රිත පරිසරය

අවදානමට ලක්ව ඇති ස්ථානය පේරාදෙනිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ (A5) පිහිටා ඇත. එම ස්ථානයේ බෑවුම් අස්ථායී වීමක් හා පාෂාණ කුට්ටි වැටීමේ තත්ත්වයක් හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශයේ ඉදිකිරීම් අවම ප්‍රමාණයක් දැකිය හැකි අතර ආසන්න මීටර් 500ක පමණ ප්‍රදේශයේ ඉතා අඩු ඉදිකිරීම් ව්‍යුහයන් ප්‍රමාණයක් දැකිය හැකිය. එම ඉදිකිරීම් ව්‍යුහයන් අතර නේවාසික ගොඩනැගිලි කිහිපයක් සිල්ලර වෙළෙඳ සැලක් දැකිය හැකිය.

ව්‍යාපෘතියට අයත් වන භූමි ප්‍රදේශය තුළ වැදගත් ස්මාරක නොමැත. උමා ඔය හඳුනාගත් ස්ථානයට පහළින් මීටර් 100ක පමණ දුරින් ගලා යනු ලබයි. මල්වත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය හඳුනාගත් ස්ථානයට ආසන්නයේ පිහිටා ඇත. හඳුනාගත් ස්ථානයට ඉහළ බෑවුම පඳුරු හා තෘණ වර්ගවලින් ගහණ වී ඇත. ඒ අතර යුකැලිප්ටස් ශාඛ විසිරී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය. හඳුනාගත් ස්ථානයට ඉහළ බෑවුමේ කෝවිලක් හා හුදෙකලා වූ තේ වත්තක් පිහිටා ඇත. ශාඛ වගා කිරීමේ ව්‍යාපෘතියක් තුළින් මාර්ගය දිගට මී සහ කුඹුක් ශාඛ රෝපණය කර ඇත.

### 4.2 වර්තමාන අවදානම් මට්ටම

වරින්වර ඇතිවන වර්ෂා තත්ත්වවලදී හේතුවෙන් මාර්ගය දිගට ඉංජිනේරුමය නොවන සිරස් බෑවුම් කැපීම් අස්ථායී වීමේ අවදානම පවතී. වර්තමානයේදී අධික වර්ෂා කාලසීමාවන්වලදී පාෂාණ කුට්ටි වැටීම් සහ සුන්බුන් වැටීම් නිරීක්ෂණය කළ හැකිය. මෙම ස්ථානයේ සිදුවිය හැකි බෑවුම් අස්ථායී වීම් හේතුවෙන් ආසන්නයේ පිහිටා ඇති සිල්ලර වෙළෙඳසැල, කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය, පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය, ජලාපවහන පද්ධතිය, NWSDB ජල නළ සැපයුම් පද්ධති, CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ විදුලි කණු, (A05) මාර්ගය භාවිත කරන මගීන්, පදිකයින් සහ රථවාහන (විශේෂයෙන්ම ආසන්න බස් නැවතුම්පොළ භාවිත කරන්නන්) සහ උමා ඔයෙහි කොටසක් අවදානමට ලක්වේ.

## 5. මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

යෝජිත ව්‍යාපෘතිය මගින් මෙම ස්ථානයේ සිදුවිය හැකි බෑවුම් අස්ථායී වීම් වැළැක්වීම සඳහා පියවර ගැනේ. මෙම ව්‍යාපෘතිය යටතේ පාංශු වැරගැන්වුම්, බෑවුම නැවත සකස් කිරීම සහ නැවත පුරවන ලද බෑවුම මත තෘණ වැවීම, බෑවුම මත නැවත ශාඛ වැස්මක් ඇති කිරීම සහ මතුපිට ජලපරිවහනය වැඩිදියුණු කිරීම වැනි අවදානම් අවමකරණ පියවර ක්‍රියාත්මක කෙරේ. මෙම ප්‍රදේශය සංවේදී පරිසර පද්ධතියක පිහිටා ඇති බැවින් පාරිසරික හිතෛශී අවදානම් අවමකරණ පියවර භාවිත කිරීම සඳහා මෙම ව්‍යාපෘතියේදී වැඩි දිරිමත් කිරීමක් සිදු කෙරේ. අවදානම් අවමකරණ ස්ථානයෙහි ප්‍රමාණවත් අවකාශයක් අනාගත අවදානම් අවමකරණ පියවර සඳහා වෙන් කර තැබීම වඩාත් යෝග්‍ය වේ.

.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංවේදී සංරචකයන්

ව්‍යාපෘතිය ක්‍රියාකාරකම් හේතුවෙන් පහත සංවේදී සංරචකයන් අවදානමට ලක්විය හැකිය.

- පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය (A05) භාවිත කරන රථවාහන, මගීන් සහ පදිකයින්
- අවදානම් අවමකරණ ස්ථානය ආසන්නයේ පිහිටි සිල්ලර වෙළෙඳසැල
- අවදානම් අවමකරණ ස්ථානය ආසන්නයේ පිහිටි මල්වත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය
- වැඩබිම ආසන්නයේ ඇති පාලම
- NWSDB ජල නළ සැපයුම් පද්ධති, CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ විදුලි කණු,
- පහළ බෑවුමේ ඇති උමා ඔය සහ එහි අතු ගංගාව
- ඉහළ බෑවුමේ පිහිටා ඇති කෝවිල

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචක සඳහා රූප සටහන 06 පරිශීලනය කරන්න

| | |
|---|---|
|  |  |
| රූප සටහන 06 (අ)- පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය | රූප සටහන 06 (ආ) - ආසන්නයේ පිහිටි සිල්ලර වෙළෙඳසැල |
|  |  |
| රූප සටහන 06 (ඇ)- මල්වත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය | රූප සටහන 06 (ඇ)- වැඩබිම ආසන්නයේ ඇති පාලම |

| | |
|---|---|
|  |  |
| රූප සටහන 06 (ඉ)- NWSDB ජල නළ සැපයුම් සහ ජලාපවහන පද්ධති | රූප සටහන 06 (ඊ)- CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ විදුලි කණු |
|  |  |
| රූප සටහන 06 (උ)- පහළ බැවුමේ ඇති උමා ඔය පෝෂක ගංගාව | රූප සටහන 06 (ඌ)- ඉහළ බැවුමේ පිහිටා ඇති කෝවිල |

රූප සටහන 06ඃ ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි

## 7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම

ව්‍යාපෘති ක්‍රියාකාරම් හේතුවෙන් සිදුවිය හැකි හිතකර සහ අහිතකර බලපෑම් සහ ඒවායේ වැදගත්කම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**බලපෑම**

## 7.1 හිතකර බලපෑම්

| |
|---|
| පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ (A5) ගමන් ගන්නා රථවාහන, මගීන් සහ පදිකයින්ගේ ආරක්ෂාව තහවුරු වීම |
| උමා ඔයෙහි අතු ගංගාවේ ජලය භාවිත කරන්නන් සහ සිල්ලර වෙළෙඳසැල හා එහි නවතා ඇති රථවාහන සුරක්ෂිත වීම |
| වර්ෂා කාලසීමාවන්හිදී පාෂාණ කුට්ටි වැටීම සහ සුන්බුන් වැටීමෙන් මෙම ස්ථානයේ මාර්ගය පටු වීම වැළැක්වීම |
| NWSDB ජල නළ සැපයුම් පද්ධති සහ ජලාපවහන පද්ධති, CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ කණු සුරක්ෂිත වීම |
| ආසන්නයේ පවතින සිල්ලර වෙළෙඳසැළ, කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය සුරක්ෂිත වීම |

## 7.2 අහිතකර බලපෑම්

### 7.2.1 ජල විද්‍යාත්මක සහ ජලයේ ගුණත්වය

| | |
|---|---|
| දේශයේ ජල පරිවහන රටාවට සිදුවන බලපෑම | වැදගත් |
| ජල දූෂණ බලපෑම | ඉතා වැදගත් |
| පාංශු ඛාදන බලපෑම සහ ඇළ මාර්ගයන්හි පතුලෙහි සිදුවන වෙනස් වීම් | වැදගත් |
| විවෘත මලපහ කිරීම සහ ජලාශ්‍රිත රෝග | වැදගත් |
| පහළ බෑවුමේ ජල භාවිතයන්ට සිදුවන බලපෑම | වැදගත් |

### 7.2.2 පාරිසරික බලපෑම

| | |
|---|---|
| ශබ්දය හා කම්පන | වැදගත් |
| වායු දූෂණ බලපෑම | වැදගත් |
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම | ඉතා වැදගත් |
| පිපුරුම් අනතුරු සහ අන්තරායකර ද්‍රව්‍ය | වැදගත් |

### 7.2.3 ජෛව විද්‍යාත්මක

| | |
|---|---|
| වෘක්ෂලතාවන්ට සිදුවන බලපෑම | නොවැදගත් |
| වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම | නොවැදගත් |

### 7.2.4 සමාජ ආර්ථික

| | |
|---|---|
| ව්‍යාපෘතියට අයත් වන සහ ආසන්න ප්‍රදේශයේ කෘෂි කාර්මික කටයුතුවලට සිදුවන බලපෑම | නොවැදගත් |
| කම්පන හේතුවෙන් ගොඩනැගිලිවල ඉරිතැලීම් ඇතිවීම | ඉතා වැදගත් |
| ඉඩම් අහිමි වීම | වැදගත් |
| ජීවනෝපාය මාර්ග/ ව්‍යාපාර සහ ආදායම් මාර්ගවලට සිදුවන බලපෑම | වැදගත් |
| සේවා සැපයුම් ජාලවලට සිදුවන බලපෑම (ජලය, මලාපද්‍රව්‍ය, විදුලිබල) | ඉතා වැදගත් |
| යටිතල පහසුකම්වලට අහිමිවීම සහ ඒවායේ ආරක්ෂාව | ඉතා වැදගත් |
| ඉදිකිරීම් අතරතුර පුද්ගලයින් වැඩිබමට ප්‍රවේශ වීමේ අවදානම | ඉතා වැදගත් |
| වැඩබිම් කඳවුරු සහ අනෙකුත් අවශ්‍යතා | ඉතා වැදගත් |
| වැඩබිම් ශ්‍රමිකයින් සහ ආසන්න ප්‍රජාව ඇතිවිය හැකි ගැටුම් හා සම්බන්ධතා | වැදගත් |
| ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව | වැදගත් |
| වැඩබිමට ප්‍රවේශ වීමට හෝ වැඩබිම හරහා ගමන් කිරීමට පුද්ගලයන්ට ඇති අවශ්‍යතාව | වැදගත් |

*රූප සටහන 07: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි හිතකර සහ අහිතකර බලපෑම් සහ ඒවායේ වැදගත්කම පිළිබඳ සාරාංශය*

## 7.1. හිතකර බලපෑම්

- යෝජිත අවදානම් අවමකරණ පියවරයන් මගින් මෙම ස්ථානයේ පිළිගත හැකි මට්ටමට බෑවුම් ස්ථායීකරණය කිරීම අරමුණු කෙරේ.
- වැලිමඩ සහ බදුල්ල නගර සම්බන්ධ කරනු ලබන පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය සුරක්ෂිත කිරීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කෙරේ. එම මාර්ගයේ ගමන් ගන්නා රථවාහන, මගීන් සහ පදිකයන්ග් ආරක්‍ෂාව තහවුරු කිරීම
- වර්ෂා තත්ත්වයන්වලදී සුන්බුන් වැටීම සහ පාෂාණ කුට්ටි වැටීම හේතුවෙන් පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය මෙම ස්ථානයෙන් පටු වීම වැළැක්වීම සහ මගීන්ගේ හා පදිකයින්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම
- අවදානම් අවමකරණ පියවර මගින් තවදුරටත් NWSDB ජල නළ සැපයුම් පද්ධති සහ ජලාපවහන පද්ධති, CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ කණු සුරක්ෂිත වීම
- වර්ෂා කාලසීමාවන්හිදී හදිසි තත්ත්වයන් ඇතිවන අවස්ථාවන්වලදී මාර්ගය අවහිරතා ඇතිවීම වැළැක්වීම සහ අනෙකුත් ප්‍රදේශ වෙත අඛණ්ඩව සහන සේවා සැපයීමේ ක්‍රියාවලිය පහසු කිරීම
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු වරින් වර කෙටි කාලීන අවදානම් අවමකරණ පියවර අවශ්‍ය නොවීමෙන් ඇතිවන සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ

## 7.2 අහිතකර බලපෑම්

අවදානම් අවමකරණ පියවර ක්‍රියාත්මක කරනු ලබන්නේ දැනටත් අස්ථායී වී ඇති හා අස්ථායී විය හැකි භූමි ප්‍රදේශය තුළයි. එබැවින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවිය හැකි අහිතරකර බලපෑම් ඉතා සීමිත අවකාශයකට හා ඉදිකිරීම් කාලයට පමණක් සීමා වේ.

*වගුව අංක 1ඃ අහිතකර බලපෑම් සහ එම බලපෑම්වල තීව්‍රතාව*

| **ඉදිකිරීම් කාලය අතරතුර සිදුවන බලපෑම්** | **බලපෑමේ තීව්‍රතාව** |
|---|---|
| **7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම** | |
| **7.2.1.1 පාසල් පරිශ්‍රයේ ජල පරිවහන රටාවන්ට සිදුවන බලපෑම**<br>මෙම ප්‍රදේශයේ විධිමත් ජල පරිවහන රටාවක් නොමැති අතර පවතින ජල පරිවහන ක්‍රමවේදය තෘණ වර්ග වැවීම හා කොළරොඩු සිරවීම හේතුවෙන් අවහිර වී ඇත. අස්ථායී බෑවුම නැවත සකස් කිරීම, සුන්බුන් ඉවත් කිරීම යනාදිය හේතුවෙන් පවතින මතුපිට හා උපමතුපිට ජල පරිවහනය අවහිර විය හැකිය. මෙම ව්‍යාපෘතියේදී ජල පරිවහනය වැඩිදියුණු කිරීම පිළිබඳව පුළුල් අවධානයක් යොමු කරනු ලබයි. ජල පරිවහන රටාව වෙනස් කිරීම, කාණු වෙනස් කිරීම සහ උපමතුපිට ජල පරිවහනය වේගවත් කිරීම යනාදිය හේතුවෙන් වර්ෂා කාලසීමාවන්හිදී ගලා යන ජල ප්‍රවාහය වේගවත් විය හැකිය.. වර්ෂා කාලය තුළ ඉදිකිරීම් කටයුතු සඳහා කැණීම් කිරීමේදී හා භූමිය හෙළි පෙහෙළි කිරීමේදී මඩ සහිත ජලය පහළ බෑවුම වෙත අඛණ්ඩව ගලා | **වැදගත්** |

| | |
|---|---|
| යාමක් සිදුවිය හැකිය. | |
| **7.2.1.2 ජල දූෂණ බලපෑම**<br>අවදානම් අවමකරණ ස්ථානයේ සිට මීටර් 100ක් පමණ දුරින් පහළ බැවුමේ උමා ඔය පිහිටා ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඍජුව ජලදූෂණයක් සිදු වීමේ හැකියාව පවතී. වර්ෂා කාල සීමාවන්හිදී මඩ, අවසාධිත, පාංශු කොටස් පහළ බැවුමට ගලා යාමෙන් ඇළ මාර්ගවල ජලය අපවිත්‍ර විය හැකිය. බෑවුම් කැණීම් කිරීමේදී, සුන්බුන් ඉවත් කිරීමේදී අවසාධිත එකතු වී පහළට ගලා යාමෙන් පහළ බෑවුමේ ජල මූලාශ්‍ර දූෂණය වීම සිදුවිය හැකිය. මෙම තත්ත්වය උමා ඔයෙන් ජලය භාවිත කරන්නන් වෙත දැඩි බලපෑමක් එල්ල කළ හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.1.3 පාංශු ඛාදන, රොන්මඩ තැන්පත් වීම සහ ගංගා පතුළෙහි වෙනස්කම්**<br>මෙම ස්ථානයේ අවදානම් අවමකරණ පියවර තුළ වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ ජල පරිවහනය වැඩි දියුණු කිරීමටය.  වර්ෂා කාල සීමාවන්හිදී ජල පරිවහන ව්‍යුහයන් හරහා ගලා යන ජල ප්‍රමාණයන් ඉහළ යා හැකි අතර අස්ථායී බෑවුම හරහා ජලය ගලා යාමද සිදුවිය හැකිය. එබැවින් විධිමත් ක්‍රමවේද භාවිතයෙන් ආවරණය නොකරන්නේ නම් පාංශු ඛාදන බලපෑම වැඩි විය හැකි අතර එමගින් උමා ඔයෙහි රොන් මඩ තැන්පත් වීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී. | **වැදගත්** |
| **7.2.1.4 විවෘත මලපහ කිරීම් සහ ජලය ආශ්‍රිත රෝග කාරකයන්**<br>වැඩබිම උමා ඔය ආසන්නයේ පිහිටා ඇති බැවින් සහ අඩු ජනවාස ව්‍යාප්තියක් සහිත බැවින් විවෘත මලපහ තිරීම් සිදු වීමේ අවදානම ඉහළ මට්ටමක පවතී. මෙම තත්ත්වය හේතුවෙන් උමා ඔයෙහි ජලය භාවිත කරනු ලබන ප්‍රජාව වෙත ජලය ආශ්‍රයෙන් බෝවන රෝග පැතිරීමේ අවදානමක් පවතී. | **වැදගත්** |
| **7.2.1.5 පහළ බෑවුමේ ජලය භාවිත කරන්නන්ට සිදුවන බලපෑම**<br>ආසන්න පදිංචිකරුවන් පහළ බෑවුමේ ඇති උමා ඔය තම දෛනික ජල අවශ්‍යතා සඳහා භාවිත නොකරනු ලබයි. ආසන්න ප්‍රජාව වෙත ජලය සැපයීම සඳහා විධිමත් ජල සැපයුම් පද්ධතියක් පවතින බැවින් අවදානම් අවමකරණ පියවර හේතුවෙන් සැලකිය යුතු බලපෑමක් සිදු නොවේ.<br>කෘෂිකාර්මික කටයුතු සහ ස්නානය වැනි අනෙකුත් අවශ්‍යතා සඳහා උමා ඔයෙහි ජලය භාවිත කරනු ලබන පුද්ගලයින් මෙම ප්‍රදේශයේ සිටින බැවින් උමා ඔයට ව්‍යාපෘතිය හේතුවෙන් යම් බලපෑමක් සිදු වන්නේ නම් මෙම පුද්ගලයින්ට අහිතකර බලපෑම් ඇතිවිය හැකිය. | **වැදගත්** |
| **7.2.2 පාරිසරික බලපෑම** | |
| **7.2.2.1 ශබ්දය හා කම්පන බලපෑම**<br>ස්ථානය සකස් කිරීම සහ එළිපෙහෙළි කිරීම සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර සූත්‍ර හේතුවෙන් කම්පන ඇතිවීම අපේක්ෂා කළ හැකිය. ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන්නේ අඩු නේවාසික ඒකක ප්‍රමාණයක් පැවතීම, වාණිජ ප්‍රදේශයක් වීම සහ  A5 මාර්ගය ආසන්නයේ වන බැවින් මෙම බලපෑම සැලකිය යුතු මට්ටමේ පවතී. වැඩබිම තුළ ශබ්ද හේතුවෙන් ආසන්න නේවාසිකයන්ට, උමා ඔය වෙත පැමිණෙන | **වැදගත්** |

| | |
|---|---|
| පුද්ගලයින්ට, පදිකයින්ට සහ මගීන්ට අවහිරතා ඇතිවිය හැකිය. වැඩබිම ආසන්නයේ සර්ප විශේෂයන්, මුගටියන් වැනි සත්ත්ව විශේෂ සහ සාමාන්‍ය පැළෑටිවලින් සමන්විත පරිසර පද්ධතියක් මෙම ප්‍රදේශයේ පවතින බැවින් ඉදිකිරීම් ශබ්ද හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකිය.<br>බර යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක වන්නේ නම්, ආසන්නයේ පිහිටි පාලම, කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය, සිල්ලර වෙළෙඳසැල, ඉහළ බෑවුමේ පිහිටි කෝවිල, ජලාපවහන කාණු සහ මාර්ගයට බලපෑම් ඇතිවිය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉරිතැලීම්, බිත්ති කඩා වැටීම් ආදී ව්‍යුහාත්මක ගැටලු ඇතිවිය හැකිය. | |
| **7.2.2.2 වායු දූෂණ බලපෑම**<br>භූමිය එළිපෙහෙළි කිරීම, ඩීසල් එංජින් ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ඉවත් කිරීම සහ සුන්බුන් පිළිස්සීම වැනි තත්ත්වයන් හේතුවෙන් වායු දූෂණයක් සිදුවිය හැකිය. වියලි කාලගුණ තත්ත්වයක් යටතේ වේගයෙන් වාහන ධාවනය කිරීම, බෑවුම් කැපීම් හා පිරවීම් සහ අවිධිමත් ලෙස සුන්බුන් ප්‍රවාහනය හා ගබඩා කර තැබීම මෙම තත්ත්වය වැඩි කිරීමට හේතුවිය හැකිය.<br><br>හඳුනාගත් ස්ථානය ආසන්නයේ අඩු ගනත්වයක් සහිත නේවාසික ඒකක, වාණිජ කටයුතු, උමා ඔයෙහි අතු ගංගාව සහ A5 මාර්ගය පිහිටා ඇති බැවින් අධික වායු දූෂණ තත්ත්වයන් ඇතිවන්නේ නම් ආසන්න ප්‍රජාවන්ට, ඇළ මාර්ගය භාවිත කරන්නන්ට, පදිකයින්ට සහ මගීන්ට මෙම බලපෑම දැඩි ලෙස බලපානු ඇත. | **වැදගත්** |
| **7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලු**<br>ඉදිකිරීම් අදියරයේදී ඉවත් කරන ආහාර ද්‍රව්‍ය, කසල ද්‍රව්‍ය සහ ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය දුර්වල වීම හේතුවෙන් පුද්ගලයින්ට අපහසුතා ඇතිකිරීම, කාණු පද්ධති අවහිර වීම තුළින් රෝගකාරක සතුන් බෝවීමට සුදුසු පරිසර නිර්මාණය වීම වැනි තත්ත්වයන් ඇතිවිය හැකිය. නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් අදියර තුළදී විධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීමක් සිදු නොවන්නේ නම් පාංශු දූෂණය සහ වෙනත් පාරිසරික බලපෑම් ඇතිවිය හැකිය. තවද, මෙම තත්ත්වය උමා ඔයෙහි සහඑහි අතු ගංගාවේ ජලය දූෂණය වීමට හේතු විය හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.2.4 පිපුරුම් අනතුරු සහ අන්තරායකර ද්‍රව්‍ය**<br>හඳුනාගත් ස්ථානය ආශ්‍රිතව පාෂාණ කුට්ටි පවතින බැවින් පිපුරුම් ද්‍රව්‍ය භාවිත කිරීම සහ පාෂාණ පිපිරවීම් සිදු කිරීම අවශ්‍ය විය හැකිය. මෙම තත්ත්වය ආසන්න පාලමට, කුඩා පරිමාණ විදුලි බලාගාරයට, උමා ඔයෙහි අතු ගංගාව භාවිත කරන්නන්ට, පදිකයින්ට සහ මගීන්ට සිදුවන බලපෑම සැලකිය යුතු මට්ටමක පවතී. | **වැදගත්** |
| **7.2.3 ජෛව විද්‍යාත්මක/ පරිසර විද්‍යාත්මක බලපෑම** | |
| **7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම**<br>ව්‍යාපෘති කටයුතු සඳහා භාවිත වන භූමි ප්‍රදේශය තුළ ඉහළ ජෛව විද්‍යාත්මක හෝ වනජීවී වාසස්ථානයන් සහිත වනාන්තර හෝ රක්ෂිත දක්නට නොලැබේ. | නොවැදගත් |

| | |
|---|---|
| **7.2.3.2 ශාඛ හා සත්ත්ව විශේෂයන්ට සිදුවන බලපෑම**<br>මෙම ප්‍රදේශයේ ඇති වැඩි ප්‍රමාණයක් ශාඛ ආවේණික, තර්ජනයට ලක් වූ හෝ IUCN විසින් රතු දත්ත පොතට ඇතුළත් කරන ලද ශා විශේෂ හෝ නොවේ. | නොවැදගත් |
| **7.2.4 සමාජ ආර්ථික බලපෑම** | |
| **7.2.4.1 ව්‍යාපෘතියට අයත් / ආසන්න භූමි ප්‍රදේශයේ කෘෂි කාර්මික කටයුතු**<br>ව්‍යාපෘති භූමිය තුළ හෝ ආසන්නයේ කෘෂිකාර්මික කටයුතු සිදු නොවේ. | නොවැදගත් |
| **7.2.4.2 කම්පන හේතුවෙන් ගොඩනැගිලි ඉරිතැලීම්**<br>වැඩබිම ආසන්නයේ බදුල්ල - පේරාදෙණිය - චෙන්කලාඩි මාර්ගය පිහිටා ඇත. මාර්ගයට සමාන්තරව ජලාපවහන පද්ධතිය ඉදිකර ඇත. වැඩබිම ආසන්නයේ මල්වත්ත වතු සමාගමට අයත් කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය පිහිටා ඇත. ඉහළ බෑවුම් ප්‍රදේශයේ කුඩා කෝවිලක් පිහිටා ඇත. ඉදිකිරීම් කටයුතු සඳහා බර යන්ත්‍රෝපකරණ භාවිත කිරීමේදී ඇතිවන කම්පන හේතුවෙන් ගොඩනැගිලි, පාලම, මාර්ගය සහ ජලාපවහන කාණු පද්ධතිවල ඉරිතැලීම් ඇතිවිය හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.4.3 ඉඩම් අහිමි වීම**<br>අවදානම් අවමකරණ ස්ථානය මල්වත්ත වතු සමාගමට අයත් ඇටම්පිටිය වත්තෙහි පිහිටා ඇත. එබැවින් ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වීම සිදුවේ.. | **වැදගත්** |
| **7.2.4.4 ජීවනෝපාය/ ව්‍යාපාරික සහ ආදායම් මාර්ගවලට සිදුවන බලපෑම**<br>හඳුනාගත් ස්ථානය ඉදිරිපසින් කුඩා සිල්ලර වෙළෙඳසැලක් පිහිටා ඇත. ඉදිකිරීම් අතරතුර ආරක්ෂාව සඳහා මෙම ගොඩනැගිල්ල තාවකාලිකව වෙනත් ස්ථානයක ස්ථාපිත කළ යුතු ය. ඒ හේතුවෙන් මෙම වෙළෙඳසැලෙහි ආදායම් සඳහා බලපෑම් ඇතිවිය හැකිය. එසේම, මූලික ඉදිකිරීම් අදියරයේදී හා පශ්චාත් ඉදිකිරීම් අදියරයේදී වැඩබිම් ශ්‍රමිකයින් තම දෛනික පරිභෝජන ද්‍රව්‍ය සහ ආහාර මිලදී ගැනීම හේතුවෙන් මෙම සිල්ලර වෙළෙඳසැලට අමතර ප්‍රතිලාභයක් ලැබිය හැකිය. | **වැදගත්** |
| **7.2.4..5 පොදු සේවා පහසුකම් ජාල සඳහා සිදුවන බලපෑම (ජලය, විදුලිය, අපද්‍රව්‍ය කාණු පද්ධති)**<br>ඉදිකිරීම් කටයුතු සහ රථවාහන ධාවනය හේතුවෙන් විදුලිබල මණ්ඩලයේ විදුලි සැපයුම් පද්ධති හා NWSDB ජල සැපයුම් පද්ධතිවලට හානි සිදුවිය හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.4.6 යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීමෙන් සිදුවන බලපෑම**<br>බොහෝ ඉදිකිරීම් කටයුතු පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය සහ පාලම ආසන්නයේ අස්ථායී බෑවුම් ප්‍රදේශයේ සිදු කරනු ලබයි. එබැවින් ඉදිකිරීම් අදියරයේදී බදුල්ල සහ වැලිමඩ නගර සම්බන්ධ වන පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ රථවාහන ධාවනය තාවකාලිකව අවහිර වනු ඇත. මෙම අවහිරතාව ඉදිකිරීම් කාලයට පමණක් සීමා වනු ඇත. පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මාර්ගයේ රථවාහන ධාවනය සීමා කරන බැවින් සාමාන්‍ය රථවාහන ධාවනය අවහිර විය හැකිය. | **ඉතා වැදගත්** |

| | |
|---|---|
| මෙම තත්ත්වය පදිකයින්ට සහ මගීන්ට අපහසුතා ඇති කළ හැකිය. අවදානම් අවමකරණ කටයුතු පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයට ආසන්න අස්ථායී බෑවුම් ප්‍රද්ශයට වැඩි වශයෙන් යොමු වන බැවින් මාර්ගය භාවිත කරන රථවාහන, පදිකයින් සහ මගීන්ගේ ආරක්‍ෂාව පිළිබඳ ගැටලු ඇතිවිය හැකිය.. | |
| **7.2.4.7 ඉදිකිරීම් අතරතුර පුද්ගලයින් වැඩබිමට ප්‍රවේශ වීම**<br>මගීන් හා පදිකයින් නිරන්තරයෙන් ගමන් ගන්නා පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ඔස්සේ කැණීම් යන්ත්‍ර, ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සිදු වේ. ආසන්න ප්‍රදේශවාසීන් විසින් භාවිත කරනු ලබන අඩි පාරක් ඉහළ බෑවුමේ පිහිටා ඇත. වැඩබිම් යන්ත්‍ර සඳහා අධිසැර විදුලි සැපයුම් භාවිත කිරීම සිදුවිය හැකිය. කොන්ක්‍රීට් ගල්, යකඩ වැනි අවිධිමත්ව ගබඩා කිරීමෙන් හා භාවිත කිරීමෙන් අනතුරු සිදුවිය හැකි දෑ වැඩබිම භාවිත කෙරේ. නොසැලකිලිමත් ලෙස වැඩබිමට ප්‍රවේශ වීමෙන් හා අපරීක්ෂාකාරී ලෙස වැඩබිම් යන්ත්‍ර භාවිතයෙන් බරපතල අනතුරු සිදුවිය හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.4.8 වැඩබිම් ඒකක සහ අනෙකුත් අවශ්‍යතා**<br>වැඩබිම් ඒකක සඳහා සාමාන්‍යයෙන් තෝරාගනු ලබන්නේ ආසන්න ප්‍රජාවට සමීප ස්ථානයකි. එබැවින් වැඩබිම් ඒකක මනාව කළමනාකරණය නොකළහොත් ශ්‍රමිකයන් පිළිබඳ ගැටලු, ආසන්න ප්‍රජාව සමග ගැටලු, පොදු පහසුකම් භාවිතය පිළිබඳ ගැටලු සහ කසල කළමනාකරණය පිළිබඳ ගැටලු වැනි ගැටලුකාරී තත්ත්වයන් ඇතිවිය හැකිය. උමා ඔය සහ එහි අතු ගංගාව පහළ බෑවුමේ පිහිටා ඇති බැවින් අවිධිමත් ලෙස වැඩබිම් ඒකක සහ කසල කළමනාකරණය හේතුවෙන් ඇළ මාර්ග දූෂණය වීමේ හැකියාව පවතී. | **ඉතා වැදගත්** |
| **7.2.4.9 වැඩබිම් ශ්‍රමිකයින්, නේවාසිකයින්, මගීන් සහ පදිකයින් අතර ගැටුම් ඇති වීම**<br>වැඩබිම සඳහා යොදා ගනු ලබන ශ්‍රමිකයින් විවිධ ප්‍රදේශ සහ සමාජ පරිසරවලින් පැමිණෙන අයවළුන් වන අතර සාමාන්‍යයෙන් අඩු අධ්‍යාපන මට්ටමක් සහ දරිද්‍රතාවෙන් පෙළෙන සමාජ පසුබිමක් සහිත වූවන් වේ. එවැනි ප්‍රජාවන් තුළ සමාජයීය ගැටලු රාශියක් පැවතිය හැකි බැවින් ආසන්න ප්‍රජාව සමඟ අසහනකාරී තත්ත්වයන් ඇතිවිය හැකිය. වැඩබිම ආසන්නයේ නේවාසික පුද්ගලයින් නොමැති බැවින් මෙම වැඩබිම සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු නොවේ.<br><br>මෙම වැඩබිම පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ආසන්නයේ පිහිටා ඇති බැවින් ඉදිකිරීම් අදියරයේදී මාර්ගය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් වසා දැමීම හේතුවෙන් පදිකයින් සහ මගීන්, වැඩබිම් ශ්‍රමිකයින් සමඟ ගැටුම් ඇති කර ගැනීමේ අවදානමක් පවතී. | **වැදගත්** |
| **7.2.4.10. කොන්ත්‍රාත්කරුවන් අතර ගැටුම් ඇතිවීම**<br><br>ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම (SSE&SMP) අනුව මෙම වැඩබිම ආසන්නයේ තවත් වැඩබිම් දෙකක් පිහිටා ඇත.<br><br>i. ස්ථානීය අංක 126 - පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී. 100/1 සහ 100/2 කණු අතර හාලි ඇළ අවදානම් අවමකරණ ස්ථානය | **වැදගත්** |

| | |
|---|---|
| ii. ස්ථානීය අංක 127 - පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී. 100/3 සහ 100/6 කණු අතර හාලි ඇළ අවදානම් අවමකරණ ස්ථානය<br><br>මෙම ව්‍යාපෘති 03 සමාන්තර කාල සීමාවක් තුළ එකිනෙකට වෙනස් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු සිදු කරන්නේ නම්, කොන්ත්‍රාත්කරුවන් අතර ගැටුම් ඇති වීමේ හැකියාව පවතී.<br><br>කොන්ත්‍රාත්කරුවන් සහ PMU අතර මනා කළමනාකාරිත්වයක් සහ සම්බන්ධීකරණයක් පවත්වාගෙන මෙම වැඩබිම සඳහා දැඩිව නිර්දේශ කෙරේ. | |
| **7.2.4.11 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂා**<br>ඇද වැටීමෙන් සිදුවන අනතුරුවලට ලක්වීමේ අවදානමට ශ්‍රමිකයින් නිරාවරණය වේ. ඉතා සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් යන්ත්‍ර භාවිතය සිදු කෙරේ. එබැවින් මෙම වැඩබිම තුළ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ රථවාහන අනතුරු ඇති වීමේ ඉහළ අවදානමක් පවතී. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා ළමා ශ්‍රමිකයින් යොදා ගතහොත් එය දැඩි අවදානම්කාරී හා අනතුරුදායී කටයුත්තක් බවට පත්වේ. මෙම වැඩබිම පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ආසන්නයේ පිහිටා ඇති බැවින් ශ්‍රමිකයින් මාර්ග අනතුරුවලට ලක්වීමේ හැකියාව පවතී. | **වැදගත්** |
| **7.2.4.12 පුද්ගලයින්ට වැඩබිමට ප්‍රවේශ වීම හෝ වැඩබිම හරහා ගමන් කිරීම**<br>අවදානම් අවමකරණ කටයුතු මල්වත්ත වතු සමාගමට අයත් ඇටම්පිටිය වත්ත තුළ සිදු කරන බැවින් එම වත්තෙහි ශ්‍රමිකයින් වැඩබිම තුළට ප්‍රවේශ විය හැකිය. ඉහළ බෑවුමේ කුඩා කෝවිලක් පවතින බැවින් වන්දනාකරුවන් වැඩබිමට ප්‍රවේශ විය හැකිය. වැඩබිම තුළ සිදු කෙරෙන පිපුරුම් ද්‍රව්‍ය, රථවාහන ධාවනය, විදුලිය භාවිතය හා ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඔවුන් අනතුරු සිදු වීමේ අවදානමට ඔවුන් නිරාවරණය වේ. | **වැදගත්** |

## 8. පාරිසරික හා සමාජයීය බලපෑම්වල තීව්‍රතාව

පාරිසරික හා සමාජයීය බලපෑම හෝ අවදානම පිළිබඳව NBRO විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

### 8.1 ප්‍රමුඛතාව දිය යුතු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු: කොන්ත්‍රාත්කරු සඳහා වන සම්මත නිර්දේශයන් ඉක්මවා අවධානය යොමු කළ සෞඛ්‍ය හා සමාජයීය සාධක

මෙම වැඩබිමෙහි ශ්‍රමිකයින්ට බෑවුම් අස්ථායී වීමේ අවදානම දරමින් දළ බෑවුම් ප්‍රදේශයක ඉදිකිරීම් කටයුතු කිරීමට සිදුවන බැවින් සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු වේ. එබැවින් මෙම වැඩබිමෙහි ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ අවධානය ඉතා වැදගත් වේ. එවැනි සුවිශේෂී පොදු E & HS ගැටලු පිළිබඳව ESMF හි සාකච්ඡා කර ඇත. එවැනි පොදු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු පිළිබඳව පිළිබඳව ESMF හිදී අවධානය යොමු කොට ඇත. ලංසු ලේඛනයේ 2003 හි වැඩ කිරීමේ කොන්දේසි සහ ප්‍රජා සුරක්ෂිතතාව කොටසෙහි 2003:5 ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් අනුකොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

### 8.2 ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය

ලංසු ලේඛනයේ 2003: වැඩකිරීමේ කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන් යටතේ 2003.3: උප කොටසෙහි ළමා හා බලහත්කාර ශ්‍රමය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

## 9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP)

7 හා 8 කොටස්වලදී හඳුනාගත් විශේෂිත බලපෑම් හා අවදානම් අවම කිරීම හෝ කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම කොටසින් දැක්වෙන්නේ පිරිසැලසුම්, ඉදිකිරීම් සහ නඩත්තු මෙහෙයුම් අදියරයන්ට අදාළව ESMP හි දැක්වෙන ස්ථානීය විශේෂිත නිර්දේශ සහ අවශ්‍යතාවන්ය.

### 9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

ව්‍යාපෘතිය හේතුවෙන් පවුල් නැවත පදිංචි කිරීමක අවශ්‍ය නොවේ.

### 9.2. පුද්ගලයින් ඉවත් කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පුද්ගලයින් ඉවත් කිරීමක් අවශ්‍ය නොවේ. එහෙත් ඉදිකිරීම් කාලය තුළ "ඇතුළු වීම තහනම්" ප්‍රදේශයක් ලෙස නම් කළ යුතු ය.

### 9.3. හානිවන ගාඩනැගිලි/ යටිතල පහසුකම් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (ඒ සඳහා හිමිකරුවන්ගේ එකගතාව ලබා ගැනීම)

මෙම ව්‍යාපෘතිය සඳහා අදාළ නොවේ.

## 9.4. ව්‍යාපෘතිය හේතුවෙන් දේපොළ / ඒවායේ භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ලබා දීමේ අවශ්‍යතාව

ඉදිකිරීම් හේතුවෙන් මල්වත්ත වතු සමාගමේ (කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය), RDA (පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය, පාලම සහ ජලාපවහන පද්ධතිය), CEB (අධිසැර විදුලි සැපයුම් ජාල කණු), NWSDB (ජල සැපයුම් පද්ධති), කුඩා කෝවිලේ හෝ සිල්ලර වෙළෙඳසැලෙහි යම් දේපොළකට හානි සිදුවුවහොත් ඊට වන්දි ලබා දීම හෝ පිළිසකර කර දීම සිදු කළ යුතු ය.

## 9.5. මහජන දැනුවත් කිරීම් සහ අවබෝධය ලබා දීම - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා

i. නායයෑම් අවදානම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන්
ii. පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ ගමන්ගන්නා මගීන් හා පදිකයින් විශේෂයෙන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව
iii. විනෝදාස්වාදය සඳහා උමා ඔය වෙත පැමිණෙන්නන් විශේෂයෙන් දැනුවත් කිරීම

## 9.6. පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/ සමාජයීය කළමනාකරණ නිර්දේශයන්

පහත සඳහන් පාරිසරික හා සමාජයීය නිර්ණායකයන් පිරිසැලසුම්කරණයේදී සලකා බැලීම නිර්දේශ කෙරේ.

*වගුව අංක 02: පිරිසැලසුම්කරණ අදියර සඳහා පාරිසරික හා සමාජයීය නිර්ණායකයන්*

| පිරිසැලසුම් අවස්ථාව | මෙම වැඩබිම සඳහා සලකා බැලිය යුතු මට්ටම |
|---|---|
| **i. ස්වභාවික සම්පත් කළමනාකරණට සහ ප්‍රශස්ථ සම්පත් උපයෝජන සැලසුම්**<br>විශාල ප්‍රදේශයක වන වැස්ම ඉවත් කිරීම් හා වැඩුණු ශාඛ ඉවත් කිරීම් අවම කිරීම සඳහා මෙම ස්ථානය පදනම්කරගත් විශේෂිත පිරිසැලසුම්කරණයේදී සැලකිලිමත් විය යුතුය. විශේෂිත ශාඛ හඳුනාගැනීමකදී එවැනි ශාඛ සංරක්ෂණය කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | මධ්‍යස්ථයි |
| **ii. වැඩබිම් සැලසුම්කරණය**<br>නැවත බැවුම් අස්ථායී වීම් සක්‍රිය වීමට ඇති හැකියාව පිළිබඳව පිරිසැලසුම්කරණයේදී අවධානය යොමු කළ යුතුය. රථ වාහන නැවැත්වීම, වැඩබිම් යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම් ද්‍රව්‍ය සහ තාවකාලික වැඩබිම් කඳවුරු ආදිය අවදානම් කලාපයේ ස්ථාපිත නොකළ යුතුය.<br>මෙම වැඩබිම පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයට සමාන්තරව සීමිත අවකාශයක පිහිටා ඇත. ඉදිකිරීම් කාල සීමාව තුළ පුහුණු සංඥා කරුවෙක් හෝ ආරක්ෂණ නිලධාරියෙකු යොදා ගැනීම සහ කොන්ත්‍රාත්කරුගේ ශ්‍රමිකයින් හා PMU අතර මනා සන්නිවේදනයක් පවත්වාගෙන යාම සිදු කළ යුතුය. | ඉතා ඉහළයි |

| | |
|---|---|
| **iii. සතුන්ගේ වාසස්ථාන සහ ගමන් මාර්ග**<br>ස්ථිර ව්‍යුහයන් සඳහා හෝ ප්‍රවේශ වීම සඳහා හෝ ගැඹුරු කාණු ඉදිකිරීම සඳහා පාරිසරික වශයෙන් හානි සිදුවිය හැකි සත්ත්ව වාසස්ථාන සහිත විශාල ප්‍රදේශයක ශාඛ ව්‍යාප්තිය ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නම්, එවැනි බලපෑම් කුඩා ප්‍රදේශයකට සීමා වුවත් පිරිසැලසුම් තුළ සත්ත්ව වාසස්ථාන සඳහා සම්බන්ධ වන ක්‍රම , සතුන්ගේ ගමන් මාර්ග සහ වෘක්ෂලතා තීරු වැනි දෑ ඇතුළත් විය යුතුය. | ඉතා අවමයි |
| **iv. ජල මූලාශ්‍ර සංරක්ෂණය**<br>පහළ බෑවුමේ උමා ඔය සහ එහි අතු ගංගාව ගලා යන බැවින් එම ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම සඳහා අවධානය යොමු කළ යුතු ය. | ඉහළයි |
| **v. විදුලි සැපයුම්, ජල පරිවහන කාණු සහ විදුලි සැපයුම් පද්ධති අවහිර වීම**<br>පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයට (A5) සමාන්තරව පවතින NWSDB ජල නළ පද්ධතිය, වැඩබිම හරහා ඇති අධිසැර විදුලි සැපයුම් පද්ධතියේ විදුලි කණුව යනාදියට මෙමගින් බලපෑම් එල්ල වේ. එබැවින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී ජල සැපයුම, ජලාපවහන කාණු, විදුලි කණුව සහ විදුලි සැපයුම් පද්ධතිය ආදියට අවහිරයක් නොවන ආකාරයට හොඳින් කළමනාකරණය කළ යුතු ය. | ඉතා ඉහළයි |
| **vi. ස්වභාවික පරිසරයට සමපාත වන පිරිසැලසුම්**<br>සංවේදී පරිසරයක් තුළ ඉදිකිරීම් සිදු කරන බැවින් පරිසර අලංකරණයට සිදුවන අහිතකර බලපෑම අවම වන පරිදි ස්වභාවික පරිසරයට සමපාත වන ව්‍යුහයන් පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. යෝග්‍ය අවදානම් අවමකරණ පිරිසැලසුම් සකස් කිරීම සඳහා භූ දර්ශන නිර්මාණ ශිල්පියෙකුගේ සේවය ලබා ගැනීම අවශ්‍ය වේ. | ඉහළයි |
| **vii. හරිත පාරිසරික ලාක්ෂණිකයන් පිළිබඳ අවධානය**<br>අවදානම් අවමකරණ පියවරයන් වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදශයක වන බැවින් පාංශු ඛාදනය වැළැක්වීම සඳහා ප්‍රාදේශීය වශයෙන් පවතින ශාඛ විශේෂ භාවිතය, පරිසරයේ ජෛව විවිධත්වය ආරක්ෂා වන පැළෑටි වර්ග භාවිතය සහ ආක්‍රමණික ශාඛ විශේෂ භාවිතයෙන් වැළකීම වැනි හරිත පාරිසරික ක්‍රමවේදයන් හැකි උපරිම අයුරින් භාවිත කිරීමට නිර්දේශ කෙරේ. | ඉහළයි |
| **viii. ශ්‍රමිකයින්ගේ සහ ප්‍රජාවගේ ආරක්ෂාව**<br>ඉදිකිරීම් අතරතුර බෑවුම් අස්ථායී වීමේ අවදානම පවතින අතර වැඩබිම් ශ්‍රමිකයින් සහ පදිකයින්, මගීන් සහ ආසන්න ප්‍රජාව මෙම අවදානමට නිරාවරණය වේ. එබැවින් ආරක්ෂිත තැනි (Berms), ආරක්ෂිත දැල් (Safety nets) වැනි ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳව පිරිසැලසුම් කරණයේදී අවධානය යොමු කළ යුතුය.<br>මෙම වැඩබිම පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයට සමීපව පිහිටා ඇති | ඉතා ඉහළයි |

| | |
|---|---|
| බැවින් වැඩබිම් ශ්‍රමිකයින්ගේ, මගීන්ගේ හා පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ඉදිකිරීම් අදියරයේදී පුහුණු සංඥාකරුවෙකු හෝ ආරක්ෂණ නිලධාරියෙකු යෙදවිය යුතු ය. | |
| **ix. පාංශු ඛාදන වැළැක්වීමේ ව්‍යුහයන්**<br>වර්ෂා කාල සීමාවන්හිදී ජල පරිවහන ව්‍යුහයන් හරහා ගලා යන ජල ප්‍රමාණයන් ඉහළ යා හැකි අතර අස්ථායී බෑවුම හරහා ජලය ගලා යාමද සිදුවිය හැකිය. මෙම ජල ප්‍රවාහ ආසන්නයේ පිහිටි වැසි ජල කාණු වෙත යොමු කළ යුතුය. එබැවින් පිරිසැලසුම්කරණයේදී පාංශු ඛාදනය අවම වන පරිදි වේගය පාලනය කිරීම සඳහා බාධක යෙදීම සඳහා අවධානය යොමු කළ යුතුය. | ඉහළයි |
| **x. අවම පශ්චාත් නඩත්තු සහ මෙහෙයුම් සහිත පිරිසැලසුම්**<br>ඉදිකිරීම් කටයුතුවලදී පාංශු ජල පරිවහනය විධිමත් කිරීම සඳහා භූ විදුම් කාණු පද්ධති (Gravity drains) වැනි තාක්ෂණික ක්‍රම භාවිත කළ යුතුය. නිවැරදි විශ්කම්භයෙන් යුත් නළ සහ භූ විදුම්, නිවැරදි බෑවුම් ආනතිය වැනි ක්‍රම භාවිතයෙන් කාණු අවහිරහ වීම් අවම කළ යුතුය. වැසි ජල කාණු පද්ධති ඍජුවම උමා ඔයට යොමු වන්නේ නම් පාංශු ඛාදනය වැළැක්වීමට අවසාධිත උගුල් වැනි පිරිවැය අවම ක්‍රමවේද සහ සැලසුම් භාවිත කළ යුතුය.<br>මෙම ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය කල්පැවැත්ම සහ කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. තවද, පිරිසැලසුම්කරණයේදී විඛාදන වැළැක්වීමේ අඩු පිරිවැය තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ සලකා බැලිය යුතුය. | ඉහළයි |

## 9.7. ඉදිකිරීම් අදියරයේදී සිදුවන බලපෑම අවම කිරීම

### 9.7.1. ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ගනු ලබන පියවර සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවදානම් අවමකිරීමේ ස්ථාන වලට පොදු වේ. එසේම එවැනි බලපෑම් බොහෝ දුරට ඉදිකිරීම් සඳහා බලපෑම් එල්ල කරන බැවින් බලපෑම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතුවේ. මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිකිරීම් අදියරයේදී පාරිසරික හා සමාජයීය සෞඛ්‍ය හා ආරක්ෂාව (E & HS) කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" පිළිබඳ පුළුල් ලේඛනයක් සකස් කර ඇත. එම ලේඛනයෙහි මෙම ස්ථානයට අදාළ ප්‍රධාන කොටස් පහත දැක්වේ (වගුව 4). විස්තර සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ESMP යොමු කළ යුතුය.

*වගුව අංක 03: ES සහ HS කළමනාකරණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාව*

| **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අනුව ESMP යොමු අංකය** | **සංරචකය** | **ව්‍යාපෘතියට අදාළත්වය** |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජයීය අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩබිම තුළ ගබඩා කිරීම් | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 2) | ශබ්දය හා කම්පන | අදාළ වේ |
| 2002.2 3) | ඉරිතැලීම් සහ ගොඩනැගිලිවලට සිදුවන හානි | බෙහෙවින් අදාළ වේ (ගොඩනැගිලි සහ මාර්ගය) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 5) | අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 6) | දූහුවිලි පාලනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය | අදාළ වේ |
| 2002.2 8) | ජලය | අදාළ වේ |
| 2002.2 9) | ශාක හා සත්ත්ව විශේෂ | අවම වශයෙන් අදාළ වේ |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | අවම වශයෙන් අදාළ වේ |
| 2002.2 11) | පාංශු ඛාදනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 12) | පාංශු දූෂණය | අදාළ වේ |
| 2002.2 13) | පස් හා වැලි ලබා ගැනීම | අදාළ නොවේ |
| 2002.2 14) | පාෂාණ ලබා ගැනීමේ ක්‍රියාවලි | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 15) | රථවාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව | අදාළ වේ |
| 2002.2 16) | මහජනතාවට සිදුවන අවහිරතා | අදාළ වේ |
| 2002.2 17) | පොදු පහසුකම් සහ යටිතල පහසුකම් | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 18) | පරිසර අලංකරණය වැඩිදියුණු කිරීම | අදාළ වේ |
| **2002.5. පාරිසරික අධීක්ෂණය** | මූලික සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | ඉදිකිරීම් සිදුකරන අතරතුර සමීක්ෂණ (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | මෙහෙයුම් කාලසීමාව තුළ සමීක්ෂණ | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | වාර්තා පවත්වාගෙන යාම | අදාළ වේ |
| **2003. වැඩ කිරීමේ කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂාව පිළිබඳ සංවිධානකරණය හා සන්නිවේදනය | බෙහෙවින් අදාළ වේ |
| 2003.3 | ළමා සහ බලහත්කාර ශ්‍රමය | බෙහෙවින් අදාළ වේ |
| 2003.4 | ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ අනතුරු දැනුම් දීම | බෙහෙවින් අදාළ වේ |
| 2003.5 | ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් | බෙහෙවින් අදාළ වේ |
| 2003.6 | ආරක්ෂාව පිළිබඳ නිරීක්ෂණ | බෙහෙවින් අදාළ වේ |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම්. | බෙහෙවින් අදාළ වේ |
| 2003.8 | සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | බෙහෙවින් අදාළ වේ |
| 2003.9 | යන්ත්‍ර සූත්‍ර සහ පුහුණු ශ්‍රමිකයින් | බෙහෙවින් අදාළ වේ |

**අදාළ වේ:** සෑම ව්‍යාපෘති වැඩබිමකටම අදාළව භාවිත කළ යුතු පොදු ESMP ලෙස මෙම කොටසින් දැක්වේ.

**බෙහෙවින් අදාළ වේ:** ආපදා අවදානම අවමකරණ ස්ථානයට අදාළව සකස් කරන ලද ESMP ට අනුකූල වන පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයක් යොමු කළ යුතුය.

**අදාළ විය හැකි:** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව ESMP හි පූරණ අවශ්‍යතා සඳහා මෙය අදාළ විය හැකිය.

**අදාළ නොවේ:** ස්ථානයේ ස්වභාවය මත මෙම කොටස් අදාළ නොවිය හැකිය.

**වෛකල්පිත:** අවශ්‍යතාවකදී භාවිත කළ හැකිය.

**ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම:** මෙම සැලැස්ම තුළ පවත්නා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

**පරිශීලනය කරන්න:** ESMP ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුගේ වගකීම

**9.7.2. ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය**

ඉදිකිරීම් කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

වගුව 04: ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්

| **අවදානම් අවම කිරීමේ සංරචක** | **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ අදියර** | **වගකීම** |
|---|---|---|
| **i. ඉදිකිරීම් අතරතුර පාංශු ඛාදන බලපෑම අවම කිරීම**<br>වර්ෂා කාලසීමාවන්හිදී වැඩබිම එළි පෙහෙළි කිරීම, බෑවුම නැවත සකස් කිරීම සහ සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යන්වල නොයෙදීම දැඩිව නිර්දේශ කෙරේ. එබැවින් ඉහළ බෑවුමේ අවදානම් අවමකරණ කටයුතු වියලි කාල සීමාවන්හිදී පමණක් සිදු කිරීමට සහ වර්ෂා කාල සීමාවන්හිදී අස්ථායී බෑවුමේ එවැනි කටයුතු සිදු නොකිරීමට හැකි සෑම විටම කටයුතු කළ යුතු ය. බෑවුම සකස් කිරීමේදී ඇති වූ සුන්බුන් හේතුවෙන් කාණු පද්ධති පිරී යාම වැළැක්වීමට අවසාධිත උගුල් හඳුන්වා දිය යුතු ය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **ii. රථවාහන කළමනාකරණ සැලැස්ම**<br>දිවා කාලයේ හා රාත්‍රී කාලයේ රථවාහන කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. වැඩබිම පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ආසන්නයේ පවතින බැවින් එම රථවාහන වාහන සැලැස්ම RDA හා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ යුතුය. ඒ තුළ අනතුරු ඇඟවීමේ සංඥා, ස්ථිර හා පුහුණු මුරකරුවෙක්, අවදානම් තත්ත්ව සහ මාර්ග බාධක පෙන්නුම් කරන ලුමිනස් සංඥා පුවරු සහ රාත්‍රී ලාම්පු වැනි දෑ සහිත විධිමත් දුම්රිය මාර්ග ආරක්ෂණ පියවර ඇතුළත් විය යුතුය. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු<br>RDA |

| | | |
|---|---|---|
| iii. **වැඩබිම තුළ ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීම**<br>අවදානම් අවමකරණ පියවරයන් ක්‍රියාත්මක කිරීමට සිදුවන්නේ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ආසන්නයේ බැවින් කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයකින් වැඩබිම තුළ ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීම පිළිබඳව සැලැස්මක් සකස් කළ යුතුය. මෙම සැලැස්ම තුළ රථවාහන නවතා තැබීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම, පිරිසිදු කිරීමේ කටයුතු යනාදිය ආරක්ෂිතව හා වැඩබිමෙහි ඉඩකඩ ප්‍රශස්ථ භාවිතයකට ලක්වන පරිදි සිදු කිරීමට යෝග්‍ය ස්ථාන ඇතුළත් විය යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| iv. **ඇතුල්වීම තහනම් ප්‍රදේශය**<br>PMU විසින් ඉදිකිරීම් අදියරයේදී බැවුම් අස්ථායී වීමක් සිදුවීමට ඇති හැකියාව පිළිබඳව විසින් පුළුල් තක්සේරුවක් සිදු කර " ඇතුල්වීම තහනම්" කලාපයක් ප්‍රකාශයට පත්කළ යුතුය.<br><br>සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ සැලැස්ම තුළ රථවාහන ධාවනය, යන්ත්‍රෝපකරණ භාවිතය හා විදුලිය කාන්දු වීම වැනි දේ තුළින් සිදුවිය හැකි අනතුරු අවදානම අවම කිරීම සඳහා අවධානය යොමු කළ යුතු ය. බෑවුම් අස්ථායීතාව දැක්වෙන සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම මෙම වැඩබිම සඳහා දැඩිව නිර්දේශ කෙරේ. | ඉදිකිරීම් අදියර | PMU හි ඒකකය<br>E & S<br>කොන්ත්‍රාත්කරු |
| v. **ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය**<br>ඉදිකිරීම් අදියරයේදී පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ වැඩබිම් රථවාහන ධාවනය සඳහා භාවිත කරනු ඇත. එබැවින් සිදුවිය හැකි මාර්ග අනතුරු, මාර්ගයට, ජලාපවහන පද්ධතියට සහ නළ ජල සැපයුමට සිදුවිය හැකි හානි වීම් පිළිබඳව දැඩි සැලකිල්ලක් දැක්විය යුතු ය. මාර්ගයට, නළ ජල පද්ධතිවලට හෝ කාණු පද්ධතිවලට යම් හානි වීමක් සිදුවුවහොත් ව්‍යාපෘතිය අතරතුර හෝ ව්‍යාපෘතියෙන් පසු ඒවා පිළිසකර කළ යුතු ය. | ඉදිකිරීම් අදියර | PMU හි ඒකකය<br>E & S<br>කොන්ත්‍රාත්කරු |
| vi. **ආක්‍රමණික විශේෂිත**<br>ආක්‍රමණික ශාඛ භාවිතයෙන් පාංශු ඛාදනය වැළැක්වීමේ ව්‍යුහයන් භාවිත නොකළ යුතු ය. ප්‍රදේශයේ ඇති ආවේණික ශාඛ ඒ සඳහා භාවිත කළ යුතු ය. ස්වභාවික ක්‍රම මගින් පාංශු ඛාදනය වැළැක්වීමේ ව්‍යුහයන් සඳහා ශාඛ භාවිත කිරීමේදී අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබා ගත යුතු ය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| vii. **ශබ්දය හා කම්පන පාලනය**<br>වැඩබිම තුළ යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීමේදී ශබ්දය හා කම්පන ඇතිවිය හැකිය. මෙම යන්ත්‍රෝපකරණ තුළින් ඇතිවන ශබ්දය හා කම්පන අවට පරිසරයට සහ ආසන්න පිහිටි නිවාසවල පදිංචිකරුවන්ට අහිතකර බලපෑම් ඇතිකළ හැකිය. එබැවින්, කම්පන ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සම්මත කම්පන මට්ටම් | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| තුළ සිදු කළ යුතු අතර කම්පන හේතුවෙන් නිවාස/ගොඩනැගිලි ව්‍යුහයන්ට හානි සිදු නොවිය යුතුය. නිවෙස්වල පවතින ඉරිතැලීම් පිළිබඳව පූර්ව සමීක්ෂණක් සිදු කළ යුතු අතර ඉදිකිරීම් අතරතුර සහ පසුව නැවත සමීක්ෂණ සිදු කළ යුතුය. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් යම් ගොඩනැගිල්ලකට හානි සිදුවුවහොත් ඊට සුදුසු වන්දි මුදලක් ලබා දිය යුතුය. | | |
| **viii. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br>ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එබැවින් අපද්‍රව්‍ය ජනනය වන්නේ නම් ඒවා වැඩබිම තුළ සෝදා හැරීම නොකළ යුතු අතර වැඩබිම තුළ විධිමත්ව ගබඩා කර PMU විසින් අනුමත කරනු ලබන ක්‍රමවේදයක් හරහා ඒවා බැහැර කළ යුතුය. පහළ බෑවුමේ උමා ඔය ගලා යන බැවින් ඉදිකිරීම් අපද්‍රව්‍ය මාර්ගය දිගට, ජලාපවාහන කාණුවලට බැහැර කිරීම නොකළ යුතු ය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **ix. දුහුවිලි සහ වායු දූෂණය පාලනය කිරීම**<br>ඉදිකිරීම් අතරතුර දුහුවිලි අංශු ජනනය වන්නේ නම් ආසන්න පදිංචිකරුවන්ට, ශ්‍රමිකයින්ට, පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය භාවිත කරන්නන්ට සහ උමා ඔය සහ එහි අතු ගංගාව වෙත අහිතකර බලපෑම් එල්ල විය හැකිය. අධික ලෙස දුහුවිලි අංශු නිකුත් වන අවස්ථාවන්හිදී විශේෂිත ආවරණ මගින් ඒවා පිටතට යාම වැළැක්විය යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x. ඉදිකිරීම් සඳහා ජලය**<br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගැනීම සිදු කළ යුත්තේ අනුමත ස්ථානවලින් පමණි. කොන්ත්‍රාත්කරු විසින් උමා ඔහෙන් ජලය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සහ අවසර ලබා ගැනීම සිදු කළ යුතු ය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xi. ඉදිකිරීම් සඳහා විදුලිය**<br>මෙම ස්ථානය ආශ්‍රිතව විදුලි බල සැපයුම් පද්ධතියක් ගමන් නොකරන බැවින් CEB සමග සාකච්ඡා කිරීමෙන් විදුලි බල සැපයුම් ක්‍රමවේදයක් සපයා ගැනීමට සිදු වේ. (මෙම ප්‍රදේශයේ ප්‍රධාන විදුලි බල සැපයුම වැඩබිමට මීටර් 100ක් පමණ දුරින් අවසන් වී ඇත). | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii. මූලිකත්වය දියයුතු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු**<br>වැඩබිමෙහි සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදුවන බැවින්, "සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව" පිළිබඳ ESMP හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ 2003 වගන්තියේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය | ඉදිකිරීම් අදියර | PMU හි ඒකකය E & S කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| වේ. විධිමත් සංවිධාන හා නියාමන ක්‍රමවේදයක් යටතේ මෙම නිර්දේශ දැඩි අවදානයකින් ක්‍රියාත්මක කළ යුතුය.<br>i. වර්ෂා කාලයේදී අස්ථායී බෑවුම් ප්‍රදේශය දැඩි අවදානම් විය හැකි බැවින් ප්‍රමාණවත් කාලසීමාවක් ඉදිකිරීම් කටයුතු නොකළ යුතුය.<br>ii. වැඩබිම් ශ්‍රමිකයින්ගේ, මගීන් සහ පදිකයින්ගේ ආරක්ෂාව උදෙසා මනා අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් සහ පූර්ණ කාලීන මුරකරුවෙක් මෙම වැඩබිම සඳහා දැඩිව නිර්දේශ කෙරේ.<br>iii. පාෂාණ කුට්ටි වැටීමෙන් ශ්‍රමිකයින් සහ ආසන්න ප්‍රජාව අනතුරට ලක්වීම වැළැක්වීම සඳහා ආරක්ෂිත දැල් (Safety nets) සහ ආරක්ෂිත බාධක යෙදිය යුතු ය.<br>iv. අනෙකුත් අනතුරු වළක්වා ගැනීම සඳහා (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත අයිතම, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) විධිමත් හදිසි අවස්ථා කළමනාකරණ ඒකකයක් මෙම ව්‍යාපෘතිය සඳහා පවත්වාගෙන යා යුතුය. | | |
| **xiii. ආරක්ෂිත ව්‍යුහයන්/ සංඥා පුවරු**<br>ඉදිකිරීම් අදියරයේදී ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත වැට ඉදිකිරීම මගින් ඉහළ බෑවුමෙන් ශ්‍රමිකයින් වැටීමේ අවදානම අවම කළ යුතු ය. බෑවුම් අස්ථායී වීමේ අවදානම දැක්වෙන අනතුරු ඇඟවීමේ සංඥා පුවරු අස්ථාවී බෑවුම් ප්‍රදේශයේ ප්‍රදර්ශනය කළ යුතුය. වර්ෂා කාල සීමාවන්හිදී මෙම අවදානම තවදුරටත් පුළුල් වන බැවින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම අත්‍යවශ්‍ය නොවුනද ව්‍යාපෘති කාල සීමාව තුළ දී සංඥා පුවරු ප්‍රදර්ශනය කළ යුතුය. | ඉදිකිරීම් අදියර | PMU හි ඒකකය<br>E & S<br>කොන්ත්‍රාත්කරු |
| **xiv. විදුලි සැපයුම් හා ජල පරිවහන කාණු පද්ධතිවලට සිදුවන හානි**<br>වැඩබිමට පහළින් මාර්ගයට සමාන්තරව NWSDB නළ ජල සැපයුම් පද්ධතිය සහ වැඩබිම හරහා CEB අධිසැර විදුලි සැපයුම් පද්ධතිය ගමන් කරයි. ඉදිකිරීම් අදියරයේදී නළ ජල සැපයුම් පද්ධති සහ විදුලි බල සැපයුම් පද්ධතිවලට හානි සිදුවීම් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.<br>ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් නළ ජල සැපයුම් පද්ධති සහ ඔවුන්ගේ දේපොළ හානි වීම වැළැක්වීම සඳහා යෝජිත ඉදිකිරීම් පිළිබඳව වැඩබිම ආසන්නයේ පිහිටා ඇති ජල පිරිපහදු ඒකකයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම හා ඔවුන් දැනුවත් කිරීම සිදු කළ යුතු ය.<br>ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ජලාපවහන පද්ධතිවලට හානි වීම හෝ අවහිරතාවක් සිදු වුවහොත් විකල්ප ජලාපවහාන ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු ය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xv. කොන්ත්‍රාත්කරුගේ ශ්‍රමිකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම්** | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| වැඩබිම් ශ්‍රමිකයින් සඳහා කොන්ත්‍රාත්කරු විසින් වෙන් වූ වැසිකිළි පහසුකම් සපයා දිය යුතුය. | | |
| **xvi. වැඩ කරනු ලබන කාලය**<br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයට පමණක් සීමා කළ යුතුය. කිසිදු හේතුවක් මත සවස 6න් පසුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම නිර්දේශ නොකෙර්. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xvii. වැඩබිමට ප්‍රවිශ වීමට හා වැඩබිම හරහා ගමන් කිරීමට පුද්ගලයින්ට ඇති අවශ්‍යතාව**<br>දැනුවත් කිරීම, අනතුරු ඇඟවීමේ සංඥා පුවරු සහ කොන්ත්‍රාත්කරු විසින් යොදවන පූර්ණ කාලීන මුරකරු යනාදිය මගින් වැඩබිම තුළට අනවසර පුද්ගලයින් ඇතුල්වීම වැළැක්වීමට කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xviii. වැඩබිම නඩත්තු කිරීම**<br>ඉදිකිරීම් අදියරයේදී පරිසරියේ ආකර්ශනීය භාවයට හානි සිදුවීම අවම වන පරිදි වැඩබිම නිවැරදිව නඩත්තු කළ යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **xix. සේවක චර්යා ධර්ම පද්ධතිය**<br>කොන්ත්‍රාත්කරු විසින් යෝග්‍ය සේවක චර්යා ධර්ම පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් වැඩබිම් සේවකයින්, ආසන්න ප්‍රජාව සහ සංචාරකයින් අතර ගැටුම් ඇතිවීම වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

### 10.7.3 වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා

පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම ඉදිකිරීම් අදියරයේදී මෙම වැඩබිමට විශේෂිත වූ අධීක්ෂණ සැලැස්මකි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනනුකූලතාව දක්වා ඇති අධීක්ෂණ ක්‍රියා පටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනය තෝරාගත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර ඡඑඹ විසින් එය අනුමත කිරීම අවශ්‍ය වේ.

*වගුව 05: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය*

| අධීක්ෂණ අවශ්‍යතාව | පරාමිතීන් | අධීක්ෂණය කළ යුතු වාර ගණන |
|---|---|---|
| i. මූලික අධීක්ෂණය | ජලයේ ගුණාත්මකභාවය | එක්වරක් * |
| | කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය, කෝවිල, සිල්ලර වෙළෙඳසැල, පාලම, පේරාදෙණිය - බදුල්ල- චෙන්කලාඩි | එක්වරක් * |

| | | |
|---|---|---|
| | මාර්ගය සහ ජලාපවාහන පද්ධතිවල ඉරිතැලීම් පිළිබඳ පූර්ව සමීක්ෂණය | |
| | භූමිය මත සිදුවන කම්පන | එක්වරක් * |
| | වාතාශ්‍රයේ ගුණාත්මක භාවයඃ විශේෂිත සාධක | එක්වරක් * |
| | වැඩබිම් ශබ්ද මිනුම් කිරීම | එක්වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | එක්වරක් * |
| | කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය, කෝවිල, සිල්ලර වෙළෙඳසැල, පාලම, පේරාදෙණිය - බදුල්ල- චෙන්කලාඩි මාර්ගය සහ ජලාපවාහන පද්ධතිවල රිතැලීම් පිළිබඳ පූර්ව සමීක්ෂණය | ඉදිකිරීම් අතරතුර නිරීක්ෂණය වන ඉරිතැලීමක් හඳුනාගත හැකි නම් ** |
| | භූමිය මත සිදුවන කම්පන | භූ විදුම්, භූ කැණීම් හෝ කම්පන ජනනය වන අනෙකුත් කටයුතු සිදු කරන විට* |
| | වැඩබිම් ශබ්දය | මාසයකට එක්වරක් අධික ශබ්දය නිකුත් වන අවස්ථාවලදී* |
| | වාතාශ්‍රයේ ගුණාත්මක භාවයඃ විශේෂිත සාධක | මාසයකට එක්වරක් * |
| iii. රථවාහනවලින් සිදු කරන විමෝචන | භාවිත කරන සියලු යන්ත්‍ර /රථවාහන විමෝචන පාලන සහතිකයක් අවශ්‍ය පරිදි ලබා ගත යුතු අතර එය උපදේශන ආයතනයේ ES නිලධාරී විසින් පරීක්ෂා කළ යුතු ය. | |
| iv. අධීක්ෂණ නියෝජිතායතන | ⋆ ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම සංරචකයන් අධීක්ෂණය කිරීම සඳහා මධ්‍යම පාරිසරික අධිකාරියේ ලියාපදිංචි කර ඇති තරඟකාරී ස්වාධීන අධික්ෂණ ආයතනයක්<br>⋆⋆ ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ සිදු කිරීම සඳහා PMU පිළිගත් නියෝජිතායතනයක් විසින් සිදු කළ යුතුයි | |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **ගොඩනැගිලිවල ඉරිතැලීම් පිළිබඳ මූලික සමීක්ෂණය** - වෘත්තීමය වාර්තා<br>**භූමියේ කම්පන තත්ත්ව** - යන්ත්‍ර සූත්‍ර භාවිතය, ඉදිකිරීම් කටයුතු සහ රථවාහන ධාවනය මගින් භූමිය මත ඇතිවන කම්පන පිළිබඳ CEA විසින් ඉදිරිපත් කර ඇති අතුරු සම්මතයන්<br>**පසුබිම් ශබ්ද මිනුම් කිරීම** - 1996 මැයි 23 දිනැති අංක 924.1 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය - CEA<br>**වායු ගුණාත්මකභාවය පිළිබඳ කරුණු** - ජාතික වායු ගුණාත්මකභාවය පිළිබඳ සම්මතයන් දැක්වෙන 2008 අගෝස්තු 15 දිනැති අංක 1562/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය- ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය | |

## 11. මහජනතාව හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම - දැනට පවත්වා ඇති සහ පැවැත්වීමට නියමිත මහජන දැනුවත් කිරීමේ වැඩසටහන්

### 11.1 මහජන දැනුවත් කිරීම

ස්ථානීය පරීක්ෂාවේදී සිල්ලර වෙළෙඳසැල් හිමිකරු සහ මල්වත්ත කුඩා පරිමාණ විදුලි බලාගාරයේ භාරකරු සමග ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීම සහ දැනුවත් කිරීම සිදු කරන ලදී. ආසන්න සිල්ලර වෙළෙඳසැලෙහි හිමිකරු ප්‍රකාශ කළ ආකාරයට 2009 වර්ෂයට ප්‍රථමයෙන් පස් කඳු කඩා වැටීම, සුන්බුන් කඩා හැලීම සහ පාෂාණ කුට්ටි වැටීම වැළැක්වීම සඳහා පේරාදෙණිය - බදුල්ල -

වෙන්කලාඩි මාර්ගය දිගට අඩි 3ක් උස රැඳවුම් බිත්තියක් ඉදිකර තිබුණු අතර 2009 වර්ෂයේදී මාර්ගය පුළුල් කිරීම සඳහා මෙම බිත්තිය කඩා ඉවත් කරන ලදී. 2012 සහ 2013 විශාල පරිමාණයේ පාෂාණ කුට්ටි කඩා වැටීමක් සිදුවිය. මාර්ගය පුළුල් කිරීම හා ඒ සඳහා ආසන්න ප්‍රදේශයේ පාෂාණ කොටස් පුපුරුවා හැරීම මේ සඳහා හේතු වී ඇත.

මල්වත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයේ භාරකරු වන ජයසේකර මහතා වර්ෂා කාල සීමාවන්වල පමණක් නොව අනෙක් අවස්ථාවලත් පාෂාණ කුට්ටි වැටීම් හා පස් හා සුන්බුන් කඩා වැටීම් සිදුවේ. ඔහු තවදුරටත් සඳහන් කළේ 2015 කළේ 2015 වර්ෂයේ මෙම ස්ථානයේ විශාල පාෂාණ කොටස් වැටීමක් සිදු විය. ඉන් මෙම කුඩා පරිමාණ බලාගාරයට, පේරාදෙණිය - බදුල්ල - වෙන්කලාඩි මාර්ගයට සහ උමා ඔය හා එහි අතු ගංගාවට බලපෑම් ඇතිවිය හැකිය.

ඔවුන් මෙම අවදානම් අවමකරණ ව්‍යාපෘතිය අපේක්ෂාවෙන් සිට ඇති අතර විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

### 10.2 පාර්ශවකරුවන්/ ආයතන දැනුවත් කිරීම

- අවදානම් අවමකරණ ස්ථානය රක්ෂිත ප්‍රදේශයක් තුළ පවතින බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා RDA හි අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. බදුල්ල කලාපයේ RDA හි ප්‍රධාන විධායක ඉංජිනේරු එස්.එස්. සේනානායක මහතා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බව සහ ඉතා අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් බවට ප්‍රකාශ කරන ලදී. ව්‍යාපෘතිය අවසානයේදී විධිමත්ව භාර දීමත්, ඉදිකිරීමෙන් පසු නඩත්තු කටයුතු RDA විසින් පවත්වාගෙන යාමත් සිදු වේ. ඉදිකිරීම් අදියරයේදී කොන්ත්‍රාත්කරු විසින් පෞද්ගලික ආරක්ෂක උපකරණ භාවිත කිරීම අනිවාර්ය වේ. සෑම විටම කොන්ත්‍රාත්කරු විසින් රථවාහන, පදිකයින්, රථවාහන ආරක්ෂණ ක්‍රමවේද සඳහා පහසු හා ආරක්ෂිත මාර්ග පහසුකම් සැපයිය යුතු අතර රාත්‍රී කාලයේදී බාධක, සංඥා කරුවන් සහ විදුලි ආලෝක සහ ඉලුමිනස් යනාදිය සැපයිය යුතු ය. ඉදිකිරීම් අපද්‍රව්‍ය/ කැණීම් සුන්බුන් යනාදිය පොදු මහජනතාව/ මගීන් සඳහා අපහසුතා ඇති නොවන ආකාරයට බැහැර කළ යුතුය.
- රක්ෂිත කොටසේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා අවදානම් අවමකරණ ස්ථානයේ පිහිටීම හා සවිස්තරාත්මක සැලසුම් RDA වෙත යොමු කළ යුතු බව RDA පළාත් අධ්‍යක්ෂ (ඌව පළාත) විසින් ප්‍රකාශ කරන ලදී.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු සිතිජ මහතාට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ව්‍යාපෘතියේ ක්‍රමවේදය, ස්ථානීය පිහිටීම අවශ්‍ය ජල ප්‍රමාණය සඳහන් කරමින් යොමු කරන ලිඛිත ඉල්ලීමක් මගින් අවසරය ලබා ගත යුතු වේ. ඉන් අනතුරුව ඔවුන්ගේ නිර්දේශ සහ අනුමැතිය ලබා දීම සිදු වේ.
- අධිසැර විදුලි සැපයුම් පද්ධතියක් වැඩබිම හරහා ගමන් කරන අතර මෙම උපපොළින් වැඩබිම සඳහා විදුලි බලය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් විධිමත් අනුමැතිය ලබා ගැනීම කළ යුතු ය. CEB බණ්ඩාරවෙල නිලධාරියාට අනුව ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය විදුලිය ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලබා ගත හැකි අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යතාව සඳහන් කරමින් අයදුම් පත්‍රයක් බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කළ යුතු ය.
- මල්වත්ත වතු සමාගමේ කළමනාකාර ඉන්දික ප්‍රේමචන්ද්‍ර මහතාට අනුව අවදානම් අවමකරණ වැඩබිම තම සමාගමට අයත් වත්තක පිහිටා ඇති බැවින් ඊට අනුමැතිය ලබා ගැනීම සඳහා

ක්‍රමවේදයක් පවතී. ඒ අනුව මල්වත්ත වතු සමාගමේ කළමනාකරු හරහා මල්වත්ත වතු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ව්‍යාපෘති යෝජනාව, යෝජිත අවදානම් අවමකරණ පියවර, අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ඇතුළත් ලිඛිත ඉල්ලීමක් සිදු කළ යුතු ය. එම ඉල්ලීම් ලිපිය හා අවශ්‍යතාව අනුව CEO විසින් අනුමැතිය ලබා දීම හෝ එම ඉල්ලීම වතු කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කිරීම සිදු වේ.

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර

COVID-19, කොරෝනා වයිරස් ආසාදනය ලොව මුළුමනින්ම තුරන් කර නැත. එබැවින් මෙම වෛරසය ව්‍යාප්තවීම වැළැක්වීමට/ පාලනය කිරීමට සහ යම් වෛරස ආසාදන තත්ත්වයක් හඳුනා ගැනීමේදී කලබලයට පත්වීම වැළැක්වීමට සියලුම කොන්ත්‍රාත්කරුවන් විසින් කොවිඩ් - 19 පූර්ව සූදානම් වීමේ සැලැස්මක් සකස් කළ යුතු අතර 2021 ජනවාරි මස (ඉදිකිරීම් කර්මාන්තය සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ 04 වන සංස්කරණය) CIDA විසින් නිකුත් කරන ලද "කොවිඩ් - 19 සහ ඩෙංගු රෝගය සඳහා සෞඛ්‍ය හා ප්‍රතිශක්තිකරණ ප්‍රවර්ධන මාර්ගෝපදේශ" අනුව එම සැලැස්ම ව්‍යාපෘති වැඩබිම් තුළ ක්‍රියාත්මක කළ යුතු ය.

## 12. ශ්‍රම කළමනාකරණය

ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ශ්‍රමිකයින් සම්බන්ධව මනා සේවක - කළමනාකරණය සබඳතා සහ ශ්‍රමිකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සාධාරණ ක්‍රමවේදයක් සැකසීම හා ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය තහවුරු කරන ලද වැඩ පරිසරයක් සැපයීම අවශ්‍ය වන අතර එහි වගකීම PMU සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුය.

එහි අරමුණු වන්නේ,

- වැඩබිම තුළ ආරක්ෂාව හා සෞඛ්‍ය තහවුරු කිරීම
- වැඩබිම් ශ්‍රමිකයින් සැමට සාධාරණව සැලකීම, වෙනස් කොට සැලකීම් වැළැක්වීම සහ සාධාරණ අවස්ථා ලබාදීම
- බලපෑමට ලක්විය හැකි කාන්තාවන්, ආබාධිත පුද්ගලයින්, ළමයින් සහ සංක්‍රමණික ශ්‍රමිකයින්, ප්‍රජා සේවකයින්, මූලික සැපයුම් ශ්‍රමිකයින් වැනි ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම
- සියලුම ආකාරයේ ළමා ශ්‍රමය හා බලහත්කාර ශ්‍රමය භාවිතය වැළැක්වීම
- ජාතික නෛතික රාමුව තුළ පවත්නා ආකාරයෙන් වැඩබිම් ශ්‍රමිකයින් සඳහා සාමූහික කේවල් කිරීම කිරීමේ නිදහස සඳහා සහයෝගය ලබා දීම
- ශ්‍රමිකයින්ට තම වැඩබිමෙහි ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ප්‍රවේශයක් ලබා දීම

## 13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවල අනුමැතිය ලබා ගැනීම

*වගුව අංක 06ඃ නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව සහ අනුමැතිය ලබා ගැනීම*

| අවශ්‍යතාව/ අනුමැතිය/ ආයතනය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|
| **13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | |
| දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය | ව්‍යාපෘති යෝජනා මහ ඇමති සහ පාර්ශ්වකරුවන්ගේ නියෝජිත ආයතන ඇතුළත් දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට යොමු කර අනුමැතිය ලබා ගත යුතුය. මෙම රැස්වීමේදී PMU හි නිලධාරියා විසින් ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම, ව්‍යාපෘති තොරතුරු අනාවරණය කිරීම සහ පාරිසරික හා සමාජීය ගැටළු ඇතුළු විවිධ කරුණු සාකච්ඡා කරනු ඇත. පැමිණ ඇති ගැටළු ESMP හි විසඳනු ඇති අතර, මෙම රැස්වීමේදී ගනු ලබන තීරණ සහ නිර්දේශ ESMP හි සලකා බලනු ලැබේ. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | වැලිමඩ ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම |
| **13.2 ව්‍යාපෘතියට අයත් වන රජයේ ඉඩම් හිමිකාරිත්වයේ අනුමැතිය ලබා ගැනීම** | |
| මධ්‍යම පරිසර අධිකාරිය | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.05.28 දිනැති අංක 1550/9 දරණ පාංශු සංරක්ෂණය පිළිබඳ අතිවිශේෂ ගැසට් පත්‍රය (පරිච්ඡේදය 450) මගින් මෙම ප්‍රදේශය සංවේදී ප්‍රදේශයක් වශයෙන් නම් කර ඇති බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව ලබා ගැනීම අවශ්‍ය වේ. |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | මෙම ප්‍රදේශයේ වනාන්තර හෝ වනජීවී වාසස්ථාන නොමැති බැවින් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ. |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | උමා ඔය සහ එහි අතු ගංගාව පහළ බෑවුමේ පිහිටා ඇති බැවින් ඉදිකිරීම් කටයුතු සඳහා ඒවායින් ජලය ලබා ගැනීමේ හැකියාවක් පවතින බැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. |
| භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනීම, ප්‍රවාහනය සහ පස්, පාෂාණ වැනි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. (අවශ්‍ය නම් පමණක්) |
| වැලිමඩ ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය සහ කුණුරොඩු බැහැර කිරීම සඳහා සොරණාතොට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම |
| ලංකා විදුලිබල මණ්ඩලය | වැඩබිම සඳහා විදුලිය ලබා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම |
| ජාතික ශාක නිරෝධායනය සේවාව | ස්වභාවික බෑවුම් ස්ථායීකරණ අවශ්‍යතා සඳහා යම් පැළෑටි හෝ බීජ විදේශ රටකින් ගෙන්වීමට අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ |

| | |
|---|---|
| | කොන්දේසි සහ බලපත්‍ර ලබා ගැනීම සඳහා 1999 අංක 35 දරණ වෘක්ෂලතා ආරක්ෂිත පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට කටුනායක පිහිටි ජාතික වෘක්ෂලතා නිරෝධායන සේවාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීම |
| ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය | හඳුනාගත් ස්ථානය පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය ආසන්නයේ පිහිටා ඇති බැවින් රථවාහන කළමනාකරණය සඳහා RDA ප්‍රාදේශීය කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. |
| ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය | NWSDB නළ ජල සැපයුම් පද්ධතියෙන් ජලය ලබා ගැනීම සඳහා NWSDB ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම |
| **13.3 ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව පිළිබඳ පෞද්ගලික ඉඩම් හිමිකරුවන් සමඟ නීත්‍යානුකූල ගිවිසුම** | |
| ඉඩම් හිමිකරු (මල්වත්ත වතු සමාගම) | ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට ඉඩම් හිමිකරු (අධ්‍යාපන දෙපාර්තමේන්තුව) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කෙරේ. |

අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව වගු අංක 07 හි දක්වා ඇත.

වගුව අංක 07: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව

| **අනුමැතිය ලබා ගැනීම** | මාසය 01 | | | | මාසය 02 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**<br>***දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***වෙනත් අනුමැතීන් ලබා ගැනීම***<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>CEB | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| GSMB | | | | | | | | |
| *ඉඩම් හිමිකරුවන්ගේ එකඟතාවය/විරුද්ධත්වයක් නොමැති බව* | | | | | | | | |

## 14. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වන පාර්ශවයන්ගේ අභියාචනා සලකා බැලීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම PMU හි ES නිලධාරීවරයාගේ වගකීමකි. (අභියාචනා සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා පාරිසරික හා සමාජයීය කළමනාකරණ වැඩසටහන් රාමුව යටතේ නිර්දේශිත ක්‍රමවේදය පරිශීලනය කරන්න)

## 15. තොරතුරු නිකුත් කිරීම

දැක්වෙන ආයතන සහ සංවිධාන වෙත අවම වශයෙන් පහත වගුවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘතිය පිළිබඳ ES තොරතුරු නිකුත් කිරීම PMU හි වගකීම වේ.

වගුව 08: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය

| තොරතුරු | යෝජිත නියෝජිතායතන | තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය විස්තර, පිරසැලසුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද) | දිස්ත්‍රික් CEA, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, අනෙකුත් දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතායතන, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| ii. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් CEA, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| iii. අධීක්ෂණ වාර්තා (මූලික හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් CEA, AIIB සහ අදාළ අනෙකුත් පාර්ශව | ප්‍රගති සමාලෝචන රැස්වීම්, විශේෂ රැස්වීම්, අවශ්‍ය වාර්තා ලබා දීම |
| iv. පාරිසරික අනුකූලතාව සහ ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා ස්ථානීය පරීක්ෂාව | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ අනෙකුත් පාර්ශව | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |
| v. ES කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ අනෙකුත් පාර්ශව | රැස්වීම්, අවශ්‍ය වාර්තා ලබා දීම |
| vi. අභියාචනා සඳහා සහන ලබා දීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |

## ඇමුණුම ☛: ස්ථානීය ස්වභාවය සහ දැනුවත් කිරීම්





*අවදානම් අවමකරණ ප්‍රදේශය*



*හඳුනාගත් ස්ථානයට පහළින් ඇති උමා ඔය*



*පාලම සහ ජල නළ පද්ධතිය*



*සිල්ලර වෙළෙඳසැල් හිමිකාරිය සමග සාකච්ඡා කිරීම*



*මල්වත්ත කුඩා බලාගාරයේ නඩත්තු භාරකරු සමග සාකච්ඡා කිරීම*